# නියමුවා


> “එය ධනපති ආණ්ඩුවක් නිසා පාන් දීම එයට කළ නොහැකිය. එයට දිය හැකි හොඳම දෙය, ‘දක්ෂ ලෙස සංවිධානය කළ දුර්භික්ෂය’ වන්නේය. නමුත් ජනතාව දුර්භික්ෂය පිළි නොගනු ඇත. පාන් තිබෙන බවත්, එය ලබා ගත හැකි බවත්, එහෙත්, එය ලබා ගත හැක්කේ ප්‍රාග්ධනයේ හා ඉඩම් හිමිකමෙහි ශුද්ධත්වයට ගරු නොකරන ක්‍රමවලින් පමණක් බවත්, ඔවුන් ඉගෙන ගනු ඇත. සමහර විට ඉතා ඉක්මනින් ඔවුන් එය ඉගෙන ගනු ඇත.”
>
> ලෙනින්
>
> තෝරාගත් කෘති,
>
> 05වැනි වෙළුම, 19 පිටුව


ISSN 1391 - 1031 | 2023 ජුනි | 27 වෙළුම | 10 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=







# කල්දැමූ ඡන්දය ලබාගැනීමට උද්ඝෝෂණ මාලාවක්

# ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමට එක්ව සටන් වදිමු

රනිල් වික්‍රමසිංහ විසින් අනීතික ලෙස, තක්කඩි ලෙස, කල්දමනු ලැබූ ජනතාවගේ අයිතියක් වූ පළාත් පාලන මැතිවරණය පවත්වන ලෙසට ආණ්ඩුවට දැවැන්ත බලපෑමක් කළ යුතුව තිබෙන බව අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, එම අයිතිය වෙනුවෙන්, නීතිමය ක්‍රියාමාර්ග සමගම ඡන්දය ලබාගැනීමට දැවැන්ත උද්ඝෝෂණ මාලාවක් අරඹන බව ප්‍රකාශ කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 31වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද පැවසීය.

“ආණ්ඩුව එක පැත්තකින් රට විනාශ කරමින් ඉන්නවා. ඒගොල්ලන් නිර්මාණය කළ අර්බුදයට උත්තර සොයන්න කියා, මූල්‍ය අරමුදල ළඟ දණ ගසා, ඔවුන්ගේ කොන්දේසිවලට යටවෙලා, ජනතාව මත දරා ගන්න බැරි බර පටවා තිබෙනවා. අනෙක් පැත්තෙන් රටේ ජාතික සම්පත් විකුණන්න පටන්ගෙන තිබෙනවා. පෙට්‍රල් ෂෙඩ් ටිකත් විකුණා කන්න පටන්ගෙන තිබෙනවා. එක පැත්තකින් විකිණීමත්, අනෙක් පැත්තෙන් ජනතාව මත බර පැටවීමත්, සහන කප්පාදු කිරීමත් කරමින් ඉන්නවා. ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, බුද්ධිමතුන් විශාල ලෙස රට හැර යමින් තිබෙනවා. එක පැත්තකින් අධ්‍යාපනය, සෞඛ්‍ය සේවය කඩාවැටෙමින් තිබෙනවා. මේ සියල්ල සිදුවෙමින් තිබියදී, “රෝමය ගිනි ගනිද්දී නීරෝ වීණා වැයුවා” වගේ රනිල් වික්‍රමසිංහ රට සවාරි ගිහිල්ලා, සාකච්ඡා සම්මන්ත්‍රණ පවත්වා ඒවායේ පම්පෝරි ගසමින් ඉන්නවා.


නමුත් අපි දන්නවා ආර්ථිකය කඩා වැටුණු තැනක තිබෙන බව. මිනිසුන්ට තුන් වේල කන්න බැරි රටක්, දිනපතා බඩු මිල ඉහළ යනවා. මිනිසෙකුට අවශ්‍ය ප්‍රෝටීන් ටික, මස්, බිත්තර ගන්න නොහැකි වෙලා තිබෙනවා. රටේ ජනතාව කුසගින්නේ සිටියෙදී, රටේ සම්පත් විකුණා දමද්දී, ජනතාව මත බදුබර පටවද්දී, ජනතාව ගැන කිසිම හැඟීමක් නැති රනිල් අපට තොරන් පෙන්වමින් කැටයම් දමමින් ඉන්නවා. ඇත්ත ගත්තොත් රට තිබෙන්නේ අගාධයකයි.

ආණ්ඩුව ඡන්ද නොපැවැත්වීමට ඉදිරිපත් කළ බොරු තර්ක දැන් බිඳවැටී ඉවරයි. අනෙක් අතට මේ ඡන්දය දින නියමයක් නැතිව කල් දැමීම නිසා දේශපාලන හිමිකම් සහිත, ඡන්දයට ඉදිරිපත් වූ රජයේ සේවකයින් විශාල පීඩාවකට ලක්වී තියෙනවා. මේ නිසා පරිපාලන අර්බුද රැසක්ද ඇති වී තිබෙනවා.

මේ තත්වය තවදුරටත් ජනතාව දරා සිටිය යුතු නැහැ. ඉවසීමේ සීමාව ඉක්මවා යමින් තිබෙනවා. වහාම ජනතාවට අයිති ඡන්දය පැවැත්වීමට බලකරන්න දැන් සිදුව තිබෙනවා. ඒ වෙනුවෙන් ජනතාව පෙළගැස්වීමට අපි සූදානම්. රනිල් වික්‍රමසිංහගෙ පාලනයට එරෙහිව ඡන්ද අයිතිය වෙනුවෙන් සටන් කිරීමට. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කිරීමට ජනතාවට අයිතියක් තිබෙනවා. ඒ අයිතිය වෙනුවෙන් එළඹෙන ජුනි 08 දින සිට ඡන්දය ලබාගැනීමට දැවැන්ත උද්ඝෝෂණ මාලාවක්, සාමකාමී, ප්‍රජාතන්ත්‍රවාදී උද්ඝෝෂණ මාලාවක් රට පුරා පැවැත්වීමට අදහස් කරනවා. ඡන්ද අයිතිය, ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමට එක්ව සටන් කරමු.”


## 03 උඩ යට මාරුවන...

සමාජ පරිවර්තනයක් සඳහා ජනයා අධිෂ්ඨානයෙන් පෙළගැසිය යුතුය. ඔවුන් වෙනස් ලෙස සිතා වෙනස් දේශපාලන තීරණ ගත යුතුය....



## 05 ජනමතයට පිටින් ‘මහ බැංකු ආණ්ඩුවක්’...

එම ණය හෝ ආණ්ඩුවෙන් ගෙවිය යුතු පොලී ආදායම ආණ්ඩුවේ ණය ප්‍රශස්තකරණය යටතේ කපා හළ හොත්, එහි පාඩුව සෘජුවම දැරීමට සිදුවන්නේ ප්‍රතිලාභීන් වන සේවකයින් හා බැංකුවල තැන්පත්කරුවන් වන මහජනතාවටය....




## 09 ක්‍රීඩාව, විනෝදය හා...

ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ලිංගික චර්යාවන් අපරාධයක් හෝ බැහැර කළ යුතු දෙයක් නොවේ. ඒවා ඉතා ස්වාභාවිකය. ඒවා දෙදෙනෙක්ගේ කැමැත්ත මත සිදුවන මානව ගරුත්වයද රැකෙන ලෙස සිදුවිය යුතු යම් සාදාචාරමය සීමාවන් තුළ පවතින දේවල්ය....





තරුණ........ 04
ජාත්‍යන්තර........ 06
ආ.ර්ථිකය ........ 07
කාන්තා........ 08
විශේෂාංග........ 10
වේදිකාව........ 11

# මැතිවරණ අපේක්ෂක චක්‍රලේඛයට එරෙහි මානව හිමිකම් පැමිණිල්ල විභාගයට



මෙවර පළාත් පාලන මැතිවරණයේදී අපේක්ෂකයින් ලෙස කටයුතු කරන රාජ්‍ය සේවකයින්ට සිදුවී ඇති අසාධාරණයට එරෙහිව සමස්ත ලංකා වෘත්තිය සමිති සම්මේලනය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම් සභාවට ගොනුකර තිබූ පැමිණිල්ල පසුගියදා විභාගයට ගන්නා ලදී.

2023 පළාත් පාලන මැතිවරණය සඳහා රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවයේ නිලධාරීන් 3000 ආසන්න ප්‍රමාණයක් පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් මගින් නාම යෝජනා භාර දී ඇති අතර රනිල් රාජපක්ෂ ආණ්ඩුව විසින් ජන මතයට බිය වී ඡන්දය කල්දමනු ලැබූ අතර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 7/2023 චක්‍රලේඛය හේතුවෙන් එම රාජ්‍ය සේවකයෝ දැඩි අර්බුදකාරී තත්වයකට පත්ව සිටිති.

කොමිෂන් සභාවේ පැමිණිලි විභාගය සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කරමින් ආයතන අධ්‍යක්ෂ ජනරාල් හා නීති නිලධාරී සම්බන්ධ වී ඇති අතර එහිදී අපේක්ෂකයින් මුහුණ දී සිටින ගැටලු පිළිබඳව දීර්ඝ ලෙස කරුණු පෙන්වා දී ඇති අතර ඉදිරියේදී මැතිවරණ කොමිසමේ අවධානයට යොමු කිරීමටත්, වැටුප් සම්බන්ධව පවතින ගැටලු සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් උපදෙස් අවශ්‍ය පරිදි ලබා දීමටත් තීරණය වූ බව සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ නියෝජ්‍ය ලේකම් චන්දන සූරියආරච්චි සහෝදරයා නියමුවා වෙත පැවසීය. එසේම ඉදිරියේදී මෙම එකඟතාවයන් අනුව කටයුතු නොවෙන්නේ නම් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත හෝ යාමට කටයුතු කරන බව පැවසූ චන්දන සහෝදරයා රාජ්‍ය සේවකයින්ට සිදු වී ඇති අසාධාරණයට එරෙහිව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව අවධාරණය කළේය.

සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ සංවිධායක ලේකම් මහින්ද ජයසිංහ, නියෝජ්‍ය ලේකම් චන්දන සූරියආරච්චි, සහ ලංකා ගුරු සේවා සංගමයේ සභාපති ධම්මික අලහප්පෙරුම යන සහෝදරවරු පැමිණිලි පාර්ශ්වය නියෝජනය කරමින් මෙම අවස්ථාවට සම්බන්ධ වූහ.

# සෞඛ්‍ය සේවාව විකිණීමට එරෙහිව අත්සන් දශලක්ෂයක පෙත්සමක්




නිදහස් සෞඛ්‍ය සේවය අවසන් කරමින් දිළිඳු රෝගීන් මහ පාරට ඇද දමන රෝගීන්ගෙන් මුදල් අය කිරීමේ ආණ්ඩුවේ තීරණය හකුළාගන්නා ලෙස බලකරමින් සෞඛ්‍ය වෘත්තීය සමිති එකමුතුව මගින් අත්සන් දශ ලක්ෂයක විරෝධතා පෙත්සමක් අත්සන් කිරීම පසුගියදා කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටින් ආරම්භ කෙරිණි.

රෝහල්වල ගෙවන වාට්ටු ඇති කිරීමේ ආණ්ඩුවේ තීරණයට මෙන්ම රෝහල් පෞද්ගලීකරණය කිරීමේ වැඩපිළිවෙළට එරෙහිව රට පුරා මෙම විරෝධතා පෙත්සම අත්සන් කිරීමේ කටයුතු සිදුකරන බව සමස්ත ලංකා වෛද්‍ය නිලධාරි සංගමයේ ප්‍රධාන ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා මෙම අවස්ථාවේදී පැවසීය. මෙම අවස්ථාව සඳහා සමස්ත ලංකා සෞඛ්‍ය වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති සමන්ත කෝරළේආරච්චි, සමස්ත ලංකා සුවසේවා සංගමයේ ලේකම් මහින්ද ගුරුගේ, පරිපූරක වෛද්‍ය සේවා මධ්‍යස්ථානය වෙනුවෙන් ඖෂධවේදී චලිත් අමරදිවාකර ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ රැසක් එක්ව සිටියහ.

# IMF ගිවිසුම පාර්ලිමේන්තුවේ සම්මත කරන්නේ ඇයි?

## වෘත්තීය සමිතිවලින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න 10 ක්




රනිල් රාජපක්ෂ ආණ්ඩුව විසින් පාර්ලිමේන්තුවේදී සම්මත කිරීමට කිරීමට නියමිත වූ IMF ගිවිසුම සඳහා විරෝධය පළකරමින් වෘත්තීය සමිති එකමුතුව මගින් යෝජනා 10 කින් යුත් ප්‍රශ්නාවලියක් පසුගියදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුවරුන් වෙත ඉදිරිපත් කරන ලදී. ආණ්ඩුව මෙම IMF ගිවිසුම විවාදයට ගෙන සම්මත කිරීමට විරෝධය පළ කරමින් ඔවුන් වෙත මෙලෙස ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ බව වෘත්තීය සමිති එකමුතුව වෙනුවෙන් වසන්ත සමරසිංහ සහෝදරයා නියමුවා වෙත පැවසීය.

එම ප්‍රශ්නාවලිය මෙසේය..

01. දේශීය හා විදේශීය වශයෙන් ලබා ගෙන ඇති ණය මුදල් ගැන ඔබගේ දැනුම්වත් වීම ප්‍රමාණවත්ද? 02. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තොරතුරු ලබාදීමකින් තොරව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟතාවයකට පැමිණීම සුදුසු යැයි ඔබ සිතනවාද? 03. ශ්‍රී ලංකාව අද හසුවී සිටින ණය උගුලේ බරපතළ බව ගැන ඔබ දැනුවත්ද? 04. ලබා ගෙන ඇති ණය මුදල් ආයෝජනය කර ඇති ව්‍යාපෘති ගැන දැනුවත්ද? 05. විදේශීය ණය රටේ ආයෝජනය සම්බන්ධයෙන් විගණකාධිපති ලබාදුන් නිර්දේශ කියවා ඇත්ද? 06. රටේ ආදායම් ඉපැයීමට තිබෙන වත්කම් සහ රාජ්‍ය ආයතන විකුණා දැමීම ගැන ඔබ එකඟද? 07. රාජ්‍ය ආයතන 400ක් පියවරෙන් පියවර විවිධ නාමකරණයෙන් විකිණීමට සූදානම් කර ඇති බව ගැන දැනුවත්ද? 08. දේශීය ණය කපාහැරීමේ අනිවාර්ය ප්‍රතිපලයක් ලෙස සේවකයන් ජීවිත කාලය පුරා දුකසේ උපයාගත් අර්ථසාධක අරමුදල අහිමිවන තත්ත්වයකට ඔබ එකඟද? 09. වෘත්තිකයින්, රාජ්‍ය සේවකයින් හා පොදු ජනතාව පීඩාවට පත්කරන අත්තනෝමතික අසාධාරණ බදු ක්‍රමය ඔබට අනුමත කළ හැකිද? 10. ජනතාව අධික ජීවන වියදම නිසා පීඩාවට පත්ව ඇති අවස්ථාවක, මහජන නියෝජිතයන් ලෙස ඔබගේ වගකීම සහ යුතුකම පිළිබඳ ඔබට අවබෝධයක් තිබෙනවාද?

# එතෙරින්...




පාස්කු ප්‍රහාරයට සාධාරණය ඉල්ලා - ඕස්ට්‍රේලියාව




ජාත්‍යන්තර කම්කරු දිනය සමරමින් - ඉතාලිය




ජාත්‍යන්තර කම්කරු දිනය සමරමින් - ජපානය



ශ්‍රී ලාංකික තරුණ තරුණියන් හමුවී - දකුණු කොරියාව




ජාත්‍යන්තර කම්කරු දිනය සමරමින් - ස්වීඩනය

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# දේශපාලනයේ රිලා නැටවීම

පසුගිය වසරේ පුපුරාගිය දැවැන්ත මහජන විරෝධය හමුවේ සිය ආරක්ෂාව පතා අඩියක් පස්සට ගත් රාජපක්ෂවරුන් ගෝඨාභයගේ ඉල්ලා අස්වීමෙන් හිස් වූ ජනාධිපති තනතුර සඳහා රනිල් වික්‍රමසිංහ පත්කළේ දේශපාලන තර්කයක් අනුවය. ඒ රනිල්ට රට තුළ මහජන බලයක් නැති නිසාත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රී බලයක් නැති නිසාත් රාජපක්ෂවරුන්ට අවශ්‍ය ලෙස රනිල්ව මෙහෙයවා ගත හැකිය; රනිල් තමන්ට අභියෝග යක් නොවන්නේය යන තර්කය මතය.

එහෙත් දැන් සිදුව තිබෙන්නේ කුමක්ද? බල්ලා විසින් වල්ගය නටවනවා වෙනුවට වල්ගය විසින් බල්ලා නටවන තැනට කටයුතු යෙදී තිබීමය. සැබැවින්ම දැන් රාජපක්ෂලාගේ තුනෙන් දෙකකට ආසන්න පාර්ලිමේන්තු බලය විධායක ජනාධිපති කෙව්ටේ බලයෙන් රනිල් විසින් රිලා නැටවීමක් බවට පත්කරනු ලැබ තිබේ.

පාර්ලිමේන්තුවේ බහුතර බලය නැතිව කොතරම් බලතල තිබුණද විධායක ජනාධිපතිවරයාට වැඩකිරීම පහසු වන්නේ නැත. 2002දී චන්ද්‍රිකා ජනාධිපති ධුරය දරද්දී රනිල් අගමැති වී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පිහිටුවා ගත් කාලයේ චන්ද්‍රිකාගේ ජනාධිපතිකම පත්වූ අසරණකම කාටත් මතක තිබිය යුතුය.

එහෙත් දැන් රනිල් ජනාධිපති ලෙස රාජපක්ෂලාගේ ආණ්ඩුවම තමන්ට අවශ්‍ය ලෙස නටවන්නට පටන්ගෙන තිබේ. අයි.එම්.එෆ්. යාම නිවැරදි බව පෙන්වීමට ඒ පිළිබඳ පාර්ලිමේන්තුවේ පැවති ඡන්ද විමසීමට රාජපක්ෂ කණ්ඩායම රනිල් වෙනුවෙන් අත් උස්සා සහාය පළ කළේය. එහෙත් කලක් ඔවුන් පෙනී සිටියේ දේශප්‍රේමීන්, අධිරාජ්‍ය විරෝධීන් හා අයි.එම්.එෆ්. විරෝධීන් ලෙසය. අයි.එම්.එෆ්. යෝජනා අනුව ජනතාව මත අධික බදුබර පටවන විට රාජපක්ෂ නඩය ඊට අනුමැතිය ලබාදුන්නේය. රනිල් රට විකුණන බවත් තමන් බලයට පැමිණි විට විකිණීම නවතා විකුණූ දේපළ යළි පවරා ගන්නා බවටත් 2019 කාලයේ වහසිබස් දෙඩූ රාජපක්ෂ නඩය දැන් රටේ වටිනාකම සම්පත් විකිණීමේ රනිල්ගේ යෝජනාවන්ට දෑත් ඔසවා සහාය දෙයි.

ලංකාවේ ජාතික ආරක්ෂාවටද සම්බන්ධ ඉන්ධන බෙදාහැරීමේ කාර්යය ඕස්ට්‍රේලියානු, අමෙරිකා, චීන සමාගම් තුනකට ලබාදීමේ පළමු පියවර ලෙස නොබෝදා චීන සමාගමට ලංකාවේ ඉන්ධන පිරවුම් හල් 150ක් පැවරීමේ ගිවිසුමද අත්සන් කරන ලදී. ඇමති මණ්ඩලයේදී පොහොට්ටුවේ සියලු ඇමතිවරුන් එය අනුමත කර ඇත. ඒ රනිල් විසින් චීනයට බදු දුන් හම්බන්තොට වරාය පවා යළි පවරාගන්නා බව කියූ රාජපක්ෂලාය.

අද රාජපක්ෂ කල්ලිය පත්ව සිටින්නේ ඉතිහාසයේ ඉතාම ඛේදනීය ඉරණමටය. දැන් රාජපක්ෂවරුන්ට මීට පෙර තිබූ, අනුහස් සහිත බල අධිකාරිත්වය නැත. දෙවන පෙළ ඇමති කණ්ඩායම මහින්දට වඩා රනිල්ට සමීපය. ඒ, ඇමති වරප්‍රසාද සඳහාය. පොහොට්ටුව ගැලවෙමින් තිබේ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නායකත්වයක් නැති, ලිහී විසුරුණු එකක් බවට පත්ව තිබේ. රනිල් හමුවේ යටවී සිටීමට ඔවුනට සිදුව ඇත්තේ ඒ නිසාය.

අවශ්‍ය නම් රනිල් වික්‍රමසිංහව දෝෂාභියෝගයකින් ඉවත් කරීමේ හැකියාව (මන්ත්‍රී බලය) රාජපක්ෂ පාලනයට නැතුවා නොවේ. එහෙත් එක් අතකින් එවැන්නකට පොහොට්ටුවේ සියලු දෙනා එකතුකර ගත හැකිද යන සැකය තිබේ. ඒ, දැනටමත් පොහොට්ටුව බෙදී ඇති නිසාය.

අනෙක් අතට රනිල් ඉවත් කළොත් රාජපක්ෂවරුන්ට, ඔවුනට හරියන ජනතා විරෝධය නොඑන කෙනෙක්ද නැත. ඒ නිසා තවත් කලක් රනිල්ගේ පිහිටෙන් සිටීමට ඔවුනට සිදුව තිබේ.

අනෙක් අතට දැන් අවශ්‍ය නම් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය රනිල්ට තිබේ. ඔහු එම බලය පෙන්නා දැන් රාජපක්ෂ කල්ලියට අනියමින් තර්ජනයද කරයි. තමන්ට බාධා කරන්නේ නම් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට සිදුවන බව ඔහු මෑතකදී පවසා තිබුණි. මේ පාර්ලිමේන්තුවේ පොහොට්ටු මන්ත්‍රී කණ්ඩායම පාර්ලිමේන්තුව විසිරවීමකට මාරාන්තික ලෙස බියවේ. මන්ද ඔවුන්ට යළි මන්ත්‍රී ධුර දිනාගැනීමට නොහැකි බැවිනි. අනෙක් අතට සමහරුන්ට මන්ත්‍රී විශ්‍රාම වැටුපද නොලැබෙන බැවිනි. ඒ නිසා දැන් පාර්ලිමේන්තුවේ රාජපක්ෂ නඩය රනිල්ගේ ප්‍රාණ ඇපකරුවන් බවට පත්ව සිටී.

සිදුවිය යුතුව තිබුණේ පාර්ලිමේන්තුවේ එක් මන්ත්‍රීකමත් පමණක් ඇති රනිල් වික්‍රමසිංහ, රාජපක්ෂ කල්ලියේ ප්‍රාණ ඇපකරුවෙකු වීමය. එහෙත් සිදුව ඇත්තේ ඔවුන් රනිල්ගේ ප්‍රාණ ඇපකරුවන් වීමය. ඉතිහාසයේ සරදම සියල්ල කණපිට හරවා ඇත්තේ එසේය.

සමාජ ක්‍රමය අර්බුදයට ගොස් පාලක පංතියද අර්බුදයට ගියවිට, මහජන බලය ඔවුනට එරෙහිව සංවිධානය වී එය ප්‍රබල බලයක් වනවිට සිය පංතියේත්, පැළැන්තියේත් පැවැත්ම වෙනුවෙන් මෙලෙස හැසිරීමට පාලක පංතීන්ට සිදුවන බව ලෝක ඉතිහාසය උගන්වා ඇත. එය දැන් ලංකාවේද දැකිය හැක.

මෙයින් පෙන්නුම් කරන්නේ, පැරණි පාලනය යල් පනිමින් යන බවත්, ඔවුනට පැරණි ක්‍රමයට තවදුරටත් රට පාලනය කළ නොහැකිව පවතින බවත්, නව සමාජයක උපත සඳහා තත්වයන් වේගයෙන් මෝරා එන බවත්ය.

# උඩ යට මාරුවන ලංකාවේ දේශපාලනය

ලංකාවේ ආර්ථිකය මෙන්ම දේශපාලනයද මේ මොහොතේ පවතින්නේ බරපතළ අර්බුදයකය. උග්‍රවී ඇති ආර්ථික අර්බුදය විසින් රටට නව ආර්ථික උපායමාර්ගයක් ඉල්ලා සිටින්නාක් මෙන්ම කුණුවී තිබෙන දේශපාලනයේද නව ගුණාත්මක වෙනසක් අර්බුදය විසින්ම ඉල්ලා සිටී.

මේ වනවිටත් ලංකාවේ දේශපාලනය උඩු යටිකුරු කිරීමට සමත් වෙනසක් සිදුවෙමින් තිබේ. ලංකාවේ ඡන්දදායකයා මෙතෙක් තමන් ගැට ගැසී සිටි සම්ප්‍රදායික ප්‍රධාන ධනේශ්වර දේශපාලන පක්ෂ අතහැර වාමවාදී ප්‍රගතිශීලී මහජන ව්‍යාපාරයක් වන ජාතික ජන බලවේගය වෙත වේගයෙන් හැරෙන්නට පටන්ගෙන තිබේ. රනිල් වික්‍රමසිංහලාට පළාත් පාලන මැතිවරණය දින නියමයක් නැතිව කල් දැමීමට සිදුවූයේද මෙම පෙරළියට ඇති වූ බිය නිසාය.



ලංකාව තුළ පසුගිය මාස කිහිපය පුරා විවිධ ආයතන විසින් සිදුකරන ලද සියලු වර්ගයේ දේශපාලන සමීක්ෂණ වාර්තාවලින් පෙන්නුම් කළේද සියලු පක්ෂ අබිබවා ජාතික ජන බලවේගයත් සියලු නායකයින් අබිබවා අනුර දිසානායක සහෝදරයාත් මහජන විශ්වාසය දිනාගෙන තිබෙන බවය. මෙය පැවති සම්ප්‍රදායික තට්ටුමාරු ප්‍රභූ නායකත්වය සහිත ධනේශ්වර දේශපාලන බල චක්‍රයට කර ඇති අභියෝගය විශාල බව ඉතා පැහැදිලිය.

සැබැවින්ම දැන් ලංකාවේ දේශපාලනයේ සැලකිය යුතු තරමේ ගුණාත්මක වෙනසක් සිදුව තිබේ. දේශපාලනයේ මෙතෙක් නොතිබුණු අලුත් තත්වයක් වර්ධනය වී තිබේ. මෙතෙක් පැවති පක්ෂ දේශපාලනය අභිබවමින් පංති දේශපාලනය පෙරට එමින් තිබේ. සමාජයේ බෙදුම් රේඛාව කලක් තිබුණේ එකම පංතියේ ලොකු පක්ෂ දෙකක කේන්ද්‍ර කරගෙනය. එහෙත් දැන් දේශපාලන බෙදුම් රේඛාව සියලු ධනේශ්වර ප්‍රතිගාමී පක්ෂ එක පසෙකටත් වමේ ප්‍රගතිශීලී කඳවුර එක පසෙකටත් වන ලෙස සලකුණු වී තිබේ. අතීතයේ ධනේශ්වර දේශපාලන පක්ෂ වටා සංකේන්ද්‍රණය වූ ජනතාව දැන් වාම ප්‍රගතිශීලී බලවේගය වටා එකතු වෙමින් තිබේ. ලංකාවේ දේශපාලන ඉතිහාසයේ ප්‍රථම වරට දේශපාලනය තුළ වාම ප්‍රගතිශීලී බලවේගයක් බලය ලබා ගැනීමේ සංවාදය තුළට පැමිණ තිබේ. එබැවින් මෙය කුමන අතින් බැලුවද දේශපාලනයේ නව තත්වයකි; ගුණාත්මක පිම්මකි.

මෙම තත්වය කලක් ප්‍රමාණාත්මකව වැඩෙමින් පැමිණ ගුණාත්මක තැනකට පැමිණියේ එක් අතකින් ජනතාවගේ ඉමහත් විශ්වාසයක් සහිතව බලයට ආ ගෝඨාභයගේ අසමත් වීමත් ආර්ථිකයේ දැවැන්ත බිඳවැටීමත් ආණ්ඩුවට එරෙහිව නිර්මාණය වූ දැවැන්ත මහජන නැගිටීම හා එය ජනයා අපේක්ෂා කළ වෙනස දක්වා ගමන් නොකිරීමත් ජාතික ජන බලවේගය ජනතා විශ්වාසය දිනාගන්නා බලවේගයක් ලෙස ගොඩනැගීමත් නිසාය.

මෙම අලුත් දේශපාලන තත්වය තුළ දැන් සම්ප්‍රදායික ධනේශ්වර පක්ෂ මෙන්ම සියලු ප්‍රතිගාමී ප්‍රතිවිප්ලවකාරී බලවේගද පැවැත්ම පිළිබඳ අර්බුදයට ගොස් තිබේ. ඔවුන් තම පැවැත්ම වෙනුවෙන් විවිධ උපක්‍රම හා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන්නටද පටන්ගෙන තිබේ.

දේශපාලනයේ සතුරන් ලෙස කලක් රඟපෑ රනිල් වික්‍රමසිංහ හා මහින්ද රාජපක්ෂ කල්ලිවලට එක්ව රට පාලනය කිරීමට සිදුවීම හා පොහොට්ටුවේ මන්ත්‍රීවරුන් ඇමතිවරුන් රැසක් රනිල්ගේ නායකත්වය ඇගයීම මීට හොඳම උදාහරණයකි. තම පංතියේ පාලනයේ පැවැත්ම වෙනුවෙන් සියලු පක්ෂ එකතු විය යුතු බවට පාලක කණ්ඩායම් තුළින් මතුවන අදහස කියා පන්නේද දැන් ඔවුන් වඳවී යාමේ තර්ජනයට මුහුණදී තිබෙන බවය.

ඊට අමතරව

සමාජ පරිවර්තනයක් සඳහා ජනයා අධිෂ්ඨානයෙන් පෙළගැසිය යුතුය. ඔවුන් වෙනස් ලෙස සිතා වෙනස් දේශපාලන තීරණ ගත යුතුය. එය හැමවිටම සිදු නොවේ. ඒ සඳහා ජනතාව දේශපාලනයෙන්ම, එහි අත්දැකීම්වලින්ම උගත යුතුය. දැන් සිදුවෙමින් තිබෙන්නේ එයයි.

හැම විටම ප්‍රධාන ධනපති පක්ෂයකට එක්වී පාලන බලයේ කොටස්කාරයින් වී දේශපාලන වරප්‍රසාද ලබාගත් ප්‍රතිගාමී අවස්ථාවාදී පුද්ගලයින්ගේ පැවැත්මද මේ අර්බුදය විසින් අභියෝගයට ලක්කරනු ලැබ ඇත. හැම විටකම මැක්කන්ට අලුත් බල්ලෙකු අවශ්‍ය වූවත් දැන් මැක්කන්ට බල්ලෙකු නැති තත්වයක් මතුව තිබේ.

මෙම දේශපාලන කැළඹීම කොතරම්ද යත් සමග කුඩා පුද්ගල කේන්ද්‍රිය කණ්ඩායම්වලට තමන්ගේ කල්ඉකුත්වූ නාමකරණ දවටන ගලවා දැන් අලුත් දවටනවලින් ඔතාගෙන 'අලුත් පෙනුමක්' ගැනීමටද බලකර ඇත. 'ඇසුරුම' අලුත් වුවත් ඒ තුළ ඇත්තේ පරණ භාණ්ඩම බව "දේශපාලන පාරිභෝගිකයා" තේරුම්ගෙන සිටියි. එපමණක් නොව ධනපති පක්ෂ සමග කිසිදු සම්බන්ධයක් ප්‍රතික්ෂේප කළ 'සුපිරිසිදු' වමේ භූමිකා රඟපෑමට ගිය කුඩා අතිවාමාංශික කල්ලිවලටද සජිත්ගේ නායකත්වයෙන් විකල්ප අන්තර්කාලීන ආණ්ඩු හැදීමට හිතෙන තරමට දේශපාලනය වෙනස්වී තිබේ.

දැන් සියල්ලෝම තම තමන්ගේ බොරු සතුරුකම් පසෙක දමා, කුඩා කුඩා වෙනස්කම් පසෙක දමා එක් දේශපාලන කඳවුරකට එකතුවීමේ සිහින දකිමින් ඒ වෙනුවෙන් කටයුතු කරමින් සිටිති. ඒ, අහෝසි වීමට නියමිත තම පැවැත්ම රැකගැනීම සඳහාත් ජාතික ජන බලවේගය ප්‍රමුඛ වාමාංශික ප්‍රගතිශීලී කඳවුර බලයට පත්වීම ප්‍රමාද කිරීම සඳහාත්ය.

සියලු ප්‍රතිගාමීන්ට දැන් තම 'පොදු සතුරා' ජ.වි.පෙ. හා ජාතික ජන බලවේගය බව පිළිගැනීමට සිදුව තිබේ. තමන්ගේ සැබෑ මුහුණුවර තවදුරටත් සඟවාගෙන සිටිය නොහැකි තරමට දේශපාලනයේ පංතිමය බෙදීම තිව්‍ර වී ඇත. සියල්ලෝම වෙන වෙනමත් එක්වත් ජ.වි.පෙ.ට, ජා.ජ.බ.ට පහර දෙමින් සිටින්නේ මේ නිසාය.

මෙම තත්වයන් විසින් දිනපතා නිර්මාණය කරමින් සිටින්නේ ලංකාව තුළ සමාජ පරිවර්තනයකට අවශ්‍ය සාධකයන් බව ඉතා පැහැදිලිය. කිසිවකුට තම කැමැත්තට, අභිලාෂයට අනුව පුළුල් සමාජ පරිවර්තනයක් සිදු කළ නොහැක. ඉතිහාසය අපට උගන්වා ඇති පාඩම එයයි. සමාජ පරිවර්තනයක් දැවැන්ත මහජන ක්‍රියාකාරිත්වයක ප්‍රතිඵලයකි. එවැන්නක් කෘත්‍රිමව නිර්මාණය කිරීමට නොහැකිවාත් මෙන්ම නිර්මාණය වූ පසු නතර කිරීමටද නොහැක.

සමාජ පරිවර්තනයක් සඳහා ජනයා අධිෂ්ඨානයෙන් පෙළගැසිය යුතුය. ඔවුන් වෙනස් ලෙස සිතා වෙනස් දේශපාලන තීරණ ගත යුතුය. එය හැමවිටම සිදු නොවේ. ඒ සඳහා ජනතාව දේශපාලනයෙන්ම, එහි අත්දැකීම්වලින්ම උගත යුතුය. දැන් සිදුවෙමින් තිබෙන්නේ එයයි.

ජනතාවට පැරණි ක්‍රමයට ජීවත් වීමට නොහැකි වීමත්, පාලකයන්ට පැරණි ක්‍රමයට පාලනය කිරීමට නොහැකිවීමත් සමාජ පරිවර්තනයකදී අවශ්‍ය ප්‍රධානම සාධකයන්ය. එහිදී ධනපති ක්‍රමය තුළ නිෂ්පාදන මාර්ග තවදුරටත් ඵලදායී නොවීමත්, ධනේශ්වර ආර්ථික අර්බුදයට ධනපති පංතිය සතුව විසඳුම් නොවීමත්, ජනතාව එකී අර්බුදයෙන් දැඩි ලෙස පීඩාවට පත්වීමත්, පවතින තත්වය වෙනස් කිරීමට ජනතාව තුළ වුවමනාව හා අධිෂ්ඨානය ඇතිවීමත්, පාලක කල්ලි දුර්වල වී බිඳී විසිර ගොස් ජනතා විශ්වාසය නැතිකර ගැනීමත් සමාජ පරිවර්තනයක් අභියස පැවතිය යුතු සාධකයන් වේ.

ඒ සියල්ල අතර පීඩාවට පත් ජනයා ඒකරාශි කර ඔවුන් සමාජ පරිවර්තනයකට මෙහෙයවීමට තරම් සමත්, පරිණත, හා මහජනතාවගේ විශ්වාසය දිනාගත් දේශපාලන ව්‍යාපාරයක් තිබීමත් අත්‍යාවශ්‍ය වේ.

ලාංකේය දේශපාලනය තුළ ඉහත සාධක සීග්‍රයෙන් වර්ධනය වෙමින් තිබේ. විටෙක වේගවත්වද විටෙක මන්දගාමීවද විටෙක සීග්‍ර ගතිකත්වයක් සහිතවද විටෙක තාවකාලික විරාමයක් සහිතවද මේ තත්වය වර්ධනය වෙමින් තිබේ. සත්‍යය එයයි. ලංකාවේ දේශපාලනය පරිවර්තනීය අවධියක පසුවන බව අප දකින්නේ මේ තත්වය අනුවය. සමාජයේ ගැඹුරු වෙනසක් අපේක්ෂා කරන බලවේග යන්ගේ කාර්ය විය යුත්තේ සිදුවෙමින් තිබෙන මෙම වෙනස තේරුම්ගෙන ඊට සවිඥානිකව මැදිහත් වීමය.




# දුකෙන් මිදීමට නම්...

ලෝකයේ දුක්ඛිතම රටවල් අතර ලංකාව එකළොස්වන ස්ථානයේ පසුවන බව ස්ටීව් හෑන්ක් නැමති ආර්ථික විශේෂඥයා විසින් කළ සමීක්ෂණයකින් හෙළිදරව් කර ඇත. අපේ රට එකළොස්වන ස්ථානයේ තිබීම ගැන පුදුම විය යුතුය. මන්ද, එම ස්ථානයේ නතර වීමට තරම්වත් සුදුසු මට්ටමේ ආර්ථිකයක් අපේ රටේ නොතිබෙන බැවිනි.

පසුගියදා අනාවරණය වූයේ ලංකාවෙ මිනිසුන් දිනකට ලබාගන්නා ආහාර වේල් ප්‍රමාණය අඩු වූ පුවතකි. ලංකාවේ සීනි ආනයනය 55%කින් අඩු වී ඇත. කිරිපිටි ආනයනය 45%කින් අඩු වී ඇත. පළතුරු ආනයනය 52%කින් අඩු වී ඇත. මෙසේ ආහාර ද්‍රව්‍ය ආනයනය අඩුවීමෙන් පෙන්නුම් කරන්නේ මිනිස්සුන්ගේ සාමාන්‍ය ආහාර පරිභෝජනය කඩාවැටී ඇති බව නොවේද?

බෙහෙත් ආනයනය 24%කින් අඩු වී ඇත. මේ නිසා මිනිස්සුන්ගේ දෛනික සෞඛ්‍ය අවශ්‍යතා සපුරා ගැනීම බිඳවැටී ඇත. අත්‍යවශ්‍ය බොහෝ බෙහෙත් වර්ග අද මිලදී ගැනීමට වෙළෙඳපොළේවත් නොමැති තත්වයක් උදාවී ඇත. රෝහලේ නම් කෙසේවත් නැත. තිබෙන බෙහෙත් පවා තත්වයෙන් ඉතාම බාල ඒවාය.

දුරකතන හා උපාංග ආනයනය 67%කින් කඩාවැටී ඇත. ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය 57%කින් හා යන්ත්‍ර සූත්‍ර ආනයනය 44%කින් කඩා වැටී ඇත. නව ඉදිකිරීම් කටයුතු අඩපණ වී ඇති බව මෙමගින් පෙන්නුම් කරයි. ඒ අනුව ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ රැකියා කළ විශාල ප්‍රමාණයකට රැකියා අහිමි වී ඇති බව පැහැදිලිය.

මෙසේ ආහාර පරිභෝජනය කඩා වැටී, සෞඛ්‍ය සේවාවන් මිලටවත් ලබාගැනීමට නොහැකි වී, රැකියා අහිමි වී, ආයතන වැසීයමින්, කෘෂිකර්මාන්තය දිනෙන් දින කඩා වැටෙන තත්වයක් තුළ අප රට දුක්ඛිත තත්වයේ එකොළොස්වන ස්ථානයේ රැඳී සිටීම ගැන පාලකයින් සතුටු විය යුතුය. අප මේ පිළිබඳව පුදුම විය යුතු නැත.

මන්ද පුදුම වීම උත්තරය නොවේ! දුක්ඛිත තත්වයෙන් මිදීමට නම් ආර්ථිකය ගොඩනැගීම ප්‍රමුඛ කාර්යය විය යුත්තේය. නමුත් රනිල් රාජපක්ෂ පාලනයට ආර්ථිකය ගොඩගැනීමට විසඳුම් නොමැත. ඇති එකම විසඳුම පරණ පාරේ වේගයෙන් යෑමය; ණය ගැනීම හා විකිණීමය. වෙනත් විකල්පයක් ධනපති පාලකයින් කිසිවෙකුට නැත.

මෙසේ පරණ පාරේ වේගයෙන් යෑමට පාලකයාට වුවමනා වුවද, ජනතාව වෙනදාට වඩා රට ගැන අවධානයෙන් සිටින නිසා ඔවුන් හිතන වේගයෙන් යෑමට අපහසු වී ඇත. මේ නිසා දැන් පාලකයාට මෙම විනාශකාරී පාරේ ජනතා අවධානයෙන් මිදී ගමන් කිරීමට ආවරණයක් ඕනෑ වී ඇත. එම ආවරණය හැමදාමත් මෙන් ගොඩනගාගත්තේ ජාතිවාදය සහ/හෝ ආගම්වාදය ඇවිස්සීම මගිනි.

මේ නිසා රනිල් රාජපක්ෂ පාලනය ජෙරම් නැමති ෆාස්ටර්වරයාට ආවරණය වෙයි. උතුරේ සිංහල වෙළඳුන්ට පහරදීම පිටුපස ආවරණය වෙයි. රාජාංගනයේ සද්දාරතන හාමුදුරුවන්ට ආවරණය වෙයි. නතාෂාට ආවරණය වෙයි. හැමදාම මෙන්ම පාලකයා ආවරණ ගොඩනගයි. යුද්ධය ඔවුන්ගේ තිස් අවුරුදු ආවරණයකි. පාස්කු ප්‍රහාරය ඔවුන්ගේ මිලේච්ඡ ආවරණයකි.

මෙසේ ඉතිහාසයේ මෙන්ම අදද සැබෑ අර්බුද යටගැසීමට පාලකයා ගොඩනගාගන්නා ආවරණවල ගොදුරු නොවී, දුක්ඛිත තත්වයෙන් සැබෑ ලෙස රට ගොඩනැගීමට හැකි, දුකින් මිදීමට හැකි මඟ විවර කරගැනීමට, අවබෝධයෙන් යුතු, වඩාත් දියුණු හා සංවිධානාත්මක අරගලයක් වෙනුවෙන් වෙහෙස විය යුතුය.

# ප්‍රේමයක් මියැදෙන්නට නොදෙව්

අඟහිඟ පෙරා දන  
අහිමුව මරා දැමූ  
දිවි අහිමි ණය මැද  
ගෙවන කල වස් සියවස්ය...  
මැරි මැරී ඉපදෙමින්  
මහ මඟ කඩාවැටෙන  
'ජීවිත'ය හඬාවැටෙන...  
එලවා දමා සතුරුසෙන්  
රැකගනුව මිනිස් දිවි  
අවැසිමය බලයක්  
ජවය පිරි යොවුන් හිත්  
පදරුත් දැන 'වෙනසක්'  
පරදා නොමිනිස් ආත්මාර්ථ  
දිනවව් මිනිස් 'පරාර්ථ'...  
ලොවක් ඇත ජයගනුව  
ඉදිරියේ අප හැම  
පලා නොගොසින මඟ හැර  
හිමි දේ බෙදාදෙන  
සැමට එක ලෙස ...

# WFDY ආසියා පැසිෆික් කලාපීය සමුළුව සඳහා SYU නේපාලයට

ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ හා ශිෂ්‍ය සම්මේලනයේ (WFDY)හි ආසියා පැසිෆික් කලාපීය සමුළුව සඳහාත් WFDYහි උපසභාපතිත්වය දරන නේපාල කොමියුනිස්ට් පක්ෂයේ (UML) තරුණ සංවිධානය වන ජාතික තරුණ සම්මේලනයේ (NYFN) 34 වැනි සංවත්සර සමුළුව සඳහාත් සහභාගි වීමට සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් එහි ජාත්‍යන්තර කටයුතු ලේකම් අංජන සම්පත් අමරසිංහ සහෝදරයාත්, සමාජවාදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් එහි ජාතික කමිටු සාමාජික සජිත් ශ්‍රීමාල් සහෝදරයාත් නේපාලයේ කත්මන්ඩු නුවර ට්‍රිබුවාන් අන්තර්ජාතික ගුවන්තොටුපළට මැයි 15 වන දින ළඟා වූ අතර එහිදී නේපාල තරුණ සම්මේලනයේ ප්‍රධාන ලේකම් බිනේ ෂා සහ පළමු ලේකම් අමිත් ලාමා යන සහෝදරවරුන් විසින් ඔවුන් ඉතා උණුසුම් ලෙස පිළිගනු ලැබිණි.




# ජවිපෙ තරුණයෝ කියුබාවට

ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ (WFDY) මහා මණ්ඩල සැසිවාරය පසුගිය මැයි 26 වන දින කියුබාවේ හවානා නගරයේදී පැවැත්විණි. මේ සඳහා සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා හා එහි ජාතික කමිටු සාමාජිකා කල්පනා මධුභාෂිණී සහෝදරිය සහභාගි වූහ.

ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ මීළඟ තරුණ සමුළුව පිළිබඳව හා ලෝකයේ දේශපාලන තත්වය පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලද අතර මෙම අවස්ථාවට සාමාජිකයෝ 100කට අධික පිරිසක් සහභාගි වූහ.

මෙහිදී කියුබාවේ විශේෂ තැන් කිහිපයක්ම නැරඹීමට අවස්ථාව ඔවුනට ලැබී තිබිණි. කියුබානු වෛද්‍ය විද්‍යාලයක්, ප්‍රාදේශීක ගම්මානයක්, විශේෂ අවශ්‍යතා දරුවන්ගේ පාසලක් (පැනමා සහයෝගිතා පාසල), කියුබානු විප්ලවීය චතුරස්‍රය, ෆිදෙල් කස්ත්‍රෝ සංස්කෘතික මධ්‍යස්ථානය ආදිය මෙම විශේෂ ස්ථාන අතර විය. මෙහිදී කියුබන් වීරයන් 05 දෙනාගෙන් කෙනෙකු වන Antonio Guerrero සහෝදරයා හමුවීමටද අවස්ථාව හිමිව තිබිණි. විශේෂයෙන් කියුබානු කොමියුනිස්ට් පක්ෂය සමඟ සුහද සාකච්ඡාවක්ද මෙහි දි සිදු විය.







## වසර මිලියන 100ක් පැරණි පොසිලයක්



ඕස්ට්‍රේලියානු මහාද්වීපයේ බටහිර ක්වීන්ස්ලන්තයේ, පාෂාණ විද්‍යාඥයින් විසින් පළමු Elasmosaur පොසිලය සොයාගෙන ඇත. මෙය නව විශේෂයක් විය හැකි බව ඔවුහු පවසති. මෙම සොයාගැනීම නව සන්ධිස්ථානයක් නියෝජනය කරන බව පැවසේ. Elasmosaurs යනු ක්‍රිටේසියස් යුගයේදී ඩයිනෝසෝරයන් සමඟ සහජීවනයෙන් සිටි දිගු ගෙල සහිත සමුද්‍ර උරගයෙකු වන ප්ලෙසියෝසෝර විශේෂයකි.

## නුදුරේදීම කෘත්‍රිම බුද්ධිය මිනිස් බුද්ධිය අභිබවන ලකුණු




Artificial Intelligent හෙවත් කෘත්‍රිම බුද්ධි තාක්ෂණය ලොවට හඳුන්වා දෙන ලද්දේ Geoffrey Hinton විසිනි. ඔහු දශකයකට වැඩි කාලයක් ගූගල් සමාගමේ විවිධ පර්යේෂණ කරමින් තමන්ගේ බුද්ධිමය දායකත්වය ලබා දෙන ලදී. මොහු ගූගල් සමාගමෙන් ඉවත් වී කෘත්‍රිම බුද්ධිය ගැන ආන්දෝලනාත්මක ප්‍රකාශයක් කළ අතර ඔහු නිපදවූ Chat GPT කෘත්‍රිම බුද්ධි මෙවලම නුදුරේදීම මිනිස් මොළය අභිබවා යමින් මිනිසාට තර්ජනයක් විය හැකි බව නිව්යෝක් ටයිම්ස් පුවත්පත් සම්මුඛ සාකච්ඡාවේදී ඔහු විසින් ප්‍රකාශ කර තිබේ.

## ලෝක කාලගුණයට තර්ජනයක් වූ එල් නිනෝවක මතුවීම



එල් නිනෝ යනු පැසිෆික් සාගරයේ උෂ්ණත්ව චක්‍රයේ උණුසුම් අවධිය වන අතර, එල් නිනෝ ලොව පුරා කාලගුණ රටා වෙත කම්පන තරංග යවමින් නව තාප වාර්තා පිහිටුවීමට, අප්‍රිකාවේ නියඟයට සහ ගෝලීය ආර්ථිකය කඩාකප්පල් කිරීමට ඉඩ ඇති අතර දැනටමත් තාප තරංග මගින් ආසියාවේ සමහර ප්‍රදේශ පිළිස්සී ගොස් ඇත. මැලේසියාව වැනි ප්‍රදේශවල භෝග තර්ජනයට ලක් කරමින් තාපය තවත් වැඩි කිරීමට හේතු වී අතර ඉදිරි මාස කිහිපය තුළ විශාල උණුසුම් එල් නිනෝවක් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය මානව-ප්‍රේරිත දේශගුණික විපර්යාස සමඟ ඒකාබද්ධ වී ගෝලීය උෂ්ණත්වය හඳුනා නොගත් අගයකට තල්ලු කරනු ඇතැයි විශ්වාස කෙරේ.

# ජනමතයට පිටින් 'මහ බැංකු ආණ්ඩුවක්' හදන මහ බැංකු පනත!

ශ්‍රී ලංකා මහ බැංකුව ස්වාධීන කිරීමට යැයි කියමින් ගෙනා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම සඳහා ආණ්ඩුව විසින් තවමත් ඉදිරිපත් කර නැත. එයට එක් හේතුවක් වී ඇත්තේ එම පනත ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝග යට ලක්කිරීම සමග සංශෝධන 58ක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදී තිබීමයි. නීති විශාරදයින් පෙන්වා දෙන්නේ, එම සංශෝධන ඇතුල් කළ විට පනත ගෙන ඒමේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ආණ්ඩුවේ වුවමනාව ඉටු නොවන බවය. දෙවැනි කරුණ වන්නේ ආණ්ඩුවේ වුවමනාවක් ලෙස මෙතෙක් කරගෙන ආ රිසි සේ මුදල් අච්චු ගැසීමට ඇති හැකියාව මෙයින් වැළැක්වෙන බැවිනි. ආණ්ඩුවට හදිසි මුදල් අවශ්‍යතා අවශ්‍ය වූ විට දැනට කරන්නේ භාණ්ඩාගාරය ලවා භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර නිකුත් කිරීමත්, ඒවා මහ බැංකුව මගින් මිලදී ගැනීමට සැලැස්වීම මගින් මුදල් අච්චු ගැසීමත්ය. මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම යනු, අන් යමක් නොව ඒ ප්‍රමාණයට නව මුදල් මුද්‍රණය කර එම භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, මහ බැංකුව ස්වාධීන කිරීම ලෙස අදහස් කරන්නේ, එම ආණ්ඩුවේ අවශ්‍යතාවයට මුදල් මුද්‍රණය කිරීමට මහ බැංකුවට ඇති හැකියාව නැති කිරීමයි. ආණ්ඩුවට එම අයිතිය දී ඇත්තේ පාර්ලිමේන්තුව මගින් ජනතාවය. දැන් ආණ්ඩුව පත්ව ඇත්තේ ගෙදර ගියොත් තෝ නසී මග සිටියොත් අඹු නසී තත්වයටය. මූල්‍ය අරමුදලේ ණය ඕනෑ නිසා පනත ගෙනාවේය. නමුත් තමන්ට ඕනෑ වෙලාවට සල්ලි මුද්‍රණය කරගත නොහැකි නිසා සම්මත කිරීමට නොහැකිය. ඒ නිසා මහ බැංකු පනත සම්මත කිරීමට පාර්ලිමේන්තුවට පනත ගෙනා ආණ්ඩුවම පනත සම්මත නොකර කල් දමා ඇත.

පනත පාර්ලිමේන්තුවේ සම්මත නොකර කල් දැමුවද ආණ්ඩුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අභිලාෂයන් කල්දමා නැත. එම නිසාම මෙම යෝජිත ශ්‍රී ලංකා මහ බැංකු පනතේ නීතිමය මෙන්ම දේශපාලනික තේරුම් ගැනීම ඉතාම වැදගත්ය.

**වැරදි සමාජයේ මහ බැංකුව නිවැරදි කිරීම**

මේ මුළු සමාජ ක්‍රමයම ගඳ ගසන කුණු වූ එකකි. එය ආර්ථිකයේද සමාජ සංස්කෘතියේද කියා වෙනසක් නැත. 75 වසරක වැරදි ආර්ථික, දේශපාලන ප්‍රතිපත්ති දිරවා ගත නොහැකිව සමාජයම දුක් විඳී. වෙනස් කළ යුත්තේ මේ සමාජයම වරදට තල්ලු කළ මේ දේශපාලනයයි. නිවැරදි කළ යුත්තේ දේශපාලන ක්‍රමයයි. මේ ක්‍රමය මෙලෙසම පවතිද්දී සමාජයේ එක ආයතනයක් හෝ පුද්ගලයකු නිවැරදි කර සමාජයම, ආර්ථික ක්‍රමය නිවැරදි කළ නොහැකිය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යෝජනා කර ඇත්තේද වැරදි දේශපාලන බලය හා ක්‍රමය එලෙසම පවත්වාගෙන යමින් මහ බැංකුව පමණක් ස්වාධීන කිරීමටය.

රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හරි හෝ වැරදි වේවා එහෙත් මූලික නීතිය ලෙස පිළිගනු ලබයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තු බලය, අධිකරණ බලය, විධායකයේ බලය නිර්වචනය කර ඇත. ඒ සියල්ල පවතින්නේ ජනතා පරමාධිපත්‍ය බලය යටතේය. 'රටේ පාලන බලය බලය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය' යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මුලින්ම සඳහන් කර ඇත්තේ එබැවිනි.

නමුත් මෙම පනතේ 05 වැනි වගන්තිය යටතේ "මහා බැංකුවට පරිපාලනමය හා මූල්‍යමය ස්වාධීනත්වය තිබිය යුතුය" යැයි දක්වා ඇත. එසේම 05 (4) යටතේද මේ පනතේ බලතල, කාර්යය හා කර්තව්‍යයට හැර වෙනත් කිසිදු පාර්ශවයකගේ උපදෙස් ඉල්ලා සිටීමක් හෝ ගැනීමක්, මහ බැංකුවේ අධිපති හෝ පාලක මණ්ඩලය (මූල්‍ය මණ්ඩලය) සිදු නොකළ යුතුයයි පුළුල් ලෙස දක්වා ඇත.

එසේම 06 වැනි වගන්තියෙන්ද දක්වා ඇත්තේ මෙම පනතේ අරමුණු සාක්ෂාත් කරගැනීම කෙරෙහි අගතියක් නොමැතිව, පනතේ විධිවිධාන යටත්ව, මහ බැංකුව ආණ්ඩුවේ පොදු ආර්ථික ප්‍රතිපත්ති රාමුවට සහාය දිය යුතුය යනුවෙනි.

මෙම කරුණු සර්ව සාධාරණ ලෙස නීතිය හා දේශපාලනය ක්‍රියාත්මක යටි අරමුණු ඉලක්ක නැති රටකට අදාළව කිසිදු වරදක් නොපෙනේ. නමුත් රටේ මූල්‍ය පාලනය කරන ආර්ථික ස්ථාවරයට ඍජුව අදාළ වන ආයතනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදන යටතේ පාර්ලිමේන්තුවට නීතියට අදාළ විය යුතුවේ. මෙම වගන්ති පාර්ලිමේන්තුව සතු එම බලය උල්ලංඝනය කරනු ලබයි. පවතින පාර්ලිමේන්තුව අන්ත දූෂිත හා මහජන මුදල් කොල්ලකන හොර කල්ලියකගේ එකතුවක් බව සැබෑය; පැහැදිලිය. ඒ නිසා කළ යුත්තේ ඒ හොරු කල්ලිය එලවා නීතිය රකින, වගවීමක් හා වගකීමක් දැරිය හැකි පාර්ලිමේන්තුවක් හැදීම මිස මුදල් මණ්ඩලයේ හා රටේ මූලික නීතියෙන් මහා බැංකුවට ඇති බැඳීම ගලවා දැමීමට ක්‍රියා කිරීම නොවේ. එසේ කළහොත්, පාර්ලිමේන්තුව විසින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03, 04, 43 හා 48 වගන්ති උල්ලංඝනය වන බව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ සඳහන් කර ඇත. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තියේ අනුව රාජ්‍ය මූල්‍ය පාලන බලය ඇත්තේ පාර්ලිමේන්තුවටය. එම සියලු නීති අභිබවන ස්වාධීනත්වයක් මහ බැංකුවට හැදිය නොහැකිය.

රටේ මූලික නීතියද අභිබවන මෙවැනි ස්වාධීනත්වයක් මහ බැංකුවට හදා ගැනීමට ඇති දේශපාලන හදිස්සිය කුමක්ද? මූල්‍ය අරමුදලේ අවශ්‍යතාව වන්නේ මේ දූෂිත ආණ්ඩුව තමන්ට අවශ්‍ය ලෙස මෙහෙයවා ගැනීමයි. එසේම ඉදිරියේදී පත්වන ජනතාවාදී පාලනයක් පවා කඩාකප්පල් කළ හැකි පරිපාලන යාන්ත්‍රණයක් හදා ගැනීමයි.

ඒ වුවමනාව ඇති බව හොඳින්ම පැහැදිලි වන්නේ දැනට මුදල් මණ්ඩලයේ (මහ බැංකුවේ පාලනය වන මූලික ඒකකය) සාමාජිකයකු ලෙස සිටින භාණ්ඩාගාරයේ ලේකම්වරයා එම තනතුරෙන් ඉවත් කිරීමට යෝජනා කිරීම හා මූල්‍ය මණ්ඩලයට සාමාන්තර තවත් පාලක මණ්ඩලයක් යෝජනා කිරීම මගිනි. එසේම 26 (1) වගන්තිය යටතේ යෝජනා කර ඇත්තේ මහ බැංකුව විසින් ළඟා කරගත යුතු උද්ධමන ඉලක්කය දැක්වෙන මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳව ගිවිසුමක් මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව විසින් අත්සන් කළ යුතු බවයි. එවිට මහ බැංකුව රටේ ඇති වෙනත් සමාගමක් වැනිය. උද්ධමනය පිළිබඳව "සේවා සැපයීමක්" වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය සමග ගිවිසුමක් අත්සන් කර ගනී. ගිවිසුමක් මගින් බැඳීමක් නැත්නම් උද්ධමනය ගැන වගකීමක් මහා බැංකුවට නැති ගාණය. අවශ්‍ය නම් කටයුතු නොකර සිටීමටද පුළුවන. 47 (2) වගන්තිය යටතේද දක්වා ඇත්තේ මහ බැංකුව අන්‍යායාකාරයකින් බලය දී නැත්නම් මිස ලංකාවේ වාසය කරන අයට ගනුදෙනු කළ හැකි මුදල් ඒකකය රුපියල බවයි. එය අමුතුවෙන් පනතකින් කිවයුතු දෙයක් නොවේ. නමුත් පනතේ එම වගන්තිය ඇතුල් කිරීමේ අරමුණ වගන්තියට එහා ගිය දෙයක් විය හැකිය. රුපියල භාවිත කළ හැක්කේ වෙනත් මුදල් ඒකකයක් සඳහා බලය දී නැත්නම්ය. බලය දී ඇත්නම් වෙනත් මුදල් ඒකකයක්ද භාවිතා කළ හැක්කේය යන්න මෙයින් නොකියා කියවේ. එම නිසා මෙය ඉන්දියානු රුපියල් ගනුදෙනු සඳහා ඉදිරියේ ආණ්ඩුවේ ඇති වුවමනාව සඳහා යොදන ලද වගන්තියක් දැයි සැක පහළ වීම වැළැක්විය නොහැකිය.




**IMF සහ මහ බැංකුව**

පවතින ආණ්ඩුව මගින් ගිවිසුම් ගත වීම හා මූල්‍ය තීරණ ගැනීමට මැදිහත්වීම මහ බැංකුවේ වගකීමයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හෝ වෙනත් ඕනෑම මූල්‍ය ආයතනයක් සමග ස්වාධීන ලෙස කටයුතු කිරීමට රටක මහ බැංකුවට හැකියාවක් නැත. නමුත් මෙම නව පනතේ 85 වැනි වගන්තිය අනුව මහ බැංකුව මෙම පනතේ බලතල ක්‍රියාත්මක කිරීමට "සම සහයෝගිත්වයක් වෙනුවෙන් කටයුතු සැලසීම සඳහා දේශීය හෝ විදේශීය නියාමන, අධීක්ෂණ හෝ මූල්‍ය අධිකාරිය සමග හෝ පොදු ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරනු ලැබිය හැකිය" යනුවෙන් වගන්තියක් යොදා ඇත. ඒ අනුව අද ආණ්ඩුව මගින් ලංකාවේ බැංකු හා මූල්‍ය පද්ධතිය ආක්‍රමණය කරන ජාත්‍යන්තර අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතන මෙම පනත් සම්මත වුවහොත් ඍජුවම තමන් විසින්ම නම් කරන මහ බැංකුවේ නියෝජිතයින් මගින් මැදිහත් වනු ඇත. තමන්ට පාලනය කළ නොහැකි ආණ්ඩුවක් පැවතියද මහ බැංකුව සමග ඍජුව ගනුදෙනු කිරීමේ දොරටුවක් ඔවුන් විවෘත කරගනු ඇත.


86 වැනි වගන්තියේ ඇත්තේ "මහ බැංකුව විසින් ඍජුව හෝ වක්‍රාකාරව ආණ්ඩුව වෙත හෝ ආණ්ඩුවට අයත් යම් පොදු අධිකාරියක් වෙත හෝ වෙනත් යම් රාජ්‍ය අස්ථිත්වයක් වෙත ණය ප්‍රදානය නොකළ යුතුය" යනුවෙනි.

මේ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේදී පවා නීතිවේදීන්ගේ අවධානයට ලක්වූයේ මේ වගන්තිය අනුව මහ බැංකුව මූල්‍ය වෙළඳපොළ ස්ථායීකරණයට මැදිහත්වීම තහනම් කිරීමක් කරන බවයි. මහ බැංකුවටත්, ආණ්ඩුවටත් පාලනය කළ නොහැකි නමුත් ආර්ථිකය මූල්‍ය ද්‍රවශීලතාවය (Liquity) පවත්වා ගැනීමට සිදුවන අවස්ථා දැනගත හැකිය. (උදා: කෝවිඩ් වසංගතය) නමුත් මෙමගින් එවැනි අවසථා පවා වැළැක්වෙන බව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පෙන්වාදී ඇත.

මේ සියලු කාරණා වෙන් වෙන්ව නොව එකට සලකන විට ලංකාවේ ඇතිවී තිබෙන ආර්ථික අර්බුදය, ණය අර්බුදය ජාත්‍යන්තර අධිරාජ්‍යවාදී බලවේග විසින් තමන්ට අවශ්‍ය රූකඩ පාලනයක් ඇති කර ගැනීමට පමණක් නොව, එම පාලනය බිඳ වැටුණු තත්වයක් යටතේදී පවා ගොඩනැගෙන නව ජනතාවාදී පාලනයක් අර්බුදයට යැවීමට අවශ්‍ය නිලධාරී යාන්ත්‍රණයක් හැදීම වෙනුවෙන් ආයතන ව්‍යුහයක් සකස් කිරීමටද ක්‍රියාකරමින් සිටින බව නව පනතින් පැහැදිලිය. ඔවුන් දුර්වල රනිල් රාජපක්ෂ පාලනය බිඳ වැටුණු පසු ගොඩනැගෙන පාලනයට මෙහෙයවීමට නොහැකි මහ බැංකු යාන්ත්‍රණයක් ඇතිකර ගැනීමට මෙම පනතින් අපේක්ෂා කර ඇත. එම නිසා මෙම යෝජිත මහ බැංකු පනත පරාජය කළ යුත්තේ පාර්ලිමේන්තුවේදී පමණක් නොව සමාජය තුළදීමය. ඒ සඳහා පොදු මහජනතාව සවිඥානිකව පෙළගැසිය යුතුව ඇත.

> රටේ මූලික නීතියද අභිබවන මෙවැනි ස්වාධීනත්වයක් මහා බැංකුවට හදා ගැනීමට ඇති දේශපාලන හදිස්සිය කුමක්ද? මූල්‍ය අරමුදලේ අවශ්‍යතාව වන්නේ මේ දූෂිත ආණ්ඩුව තමන්ට අවශ්‍ය ලෙස මෙහෙයවා ගැනීමයි. එසේම ඉදිරියේදී පත්වන ජනතාවාදී පාලනයක් පවා කඩාකප්පල් කළ හැකි පරිපාලන යාන්ත්‍රණයක් හදා ගැනීමයි.

# **ස්වාධීන බල කේන්ද්‍රයක්** බවට වර්ධනය වන **යුරෝපය**




2022 වසරේ නොවැම්බරයේ සිට යුරෝපයේ ප්‍රධාන රටවල් කිහිපයකම නායකයෝ ගණනාවක්ම චීනයේ සංචාරයන්හි නිරත වූහ. එය යුරෝපය 'චීනයෙන් ගලවා ගැනීම' සඳහා වන එක්සත් ජනපද උත්සාහයට එරෙහි හා යුරෝපයේ තීරණාත්මක ප්‍රතිපත්තිමය වෙනසක් සලකුණු කරන්නක් බව දේශපාලන විචාරකයන්ගේ මතයයි.

මෙලෙස චීනයේ සංචාරයේ යෙදුණු නායකයන් නම් ජර්මන් චාන්සලර් ඔලාෆ් ෂෝල්ස් (2022 නොවැම්බර්), ස්පාඤ්ඤයේ පෙඩ්‍රෝ සාන්චේස් (2023 මාර්තු), යුරෝපා කොමිසමේ උර්සුලා වොන් ඩේලියන් හා ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රෝන්ය. යුරෝපීය කවුන්සලයේ සභාපති චාල්ස් මයිකල් පසුගිය අවුරුද්දේ අග චීනයේ තනිවම සංචාරය කළේ එතෙක් පැවති ක්‍රමය වූ යුරෝපා කොමිසමේ සභාපතිවරයා සමග එක්ව සංචාරය කිරීමේ සම්ප්‍රදායද කඩකරමිනි. ප්‍රංශ ජනාධිපති මැක්‍රෝන් චීනයේ සංචාරය කළේ එයාර්බස් සමාගම ඇතුළු ප්‍රංශ ව්‍යාපාරයන් ගණනාවක් නියෝජනය කරන විධායක නිලධාරීන් 60 කට අධික සංඛ්‍යාවක් සමගය. ජර්මන් චාන්සලර් ඔලාෆ් සිය චීන සංචාරයේදී ප්‍රකාශ කර සිටියේ 'යුරෝපය හැරවුම් ලක්ෂයක් හරහා ගමන් කරමින් සිටින බව'ය.

එක්සත් ජනපදය එහි නවතම න්‍යාය පත්‍රය වන 'සීතල යුද්ධය 2.0' අනුව යුරෝපා සංගමය දැනට අනුගමනය කරන 'චීනය දෙස බලා සිටීමේ' ප්‍රතිපත්තියෙන් ඉවතට ගෙන චීන විරෝධී ස්ථාවරයට ගෙනඒමට උත්සාහ කරමින් සිටියද එය එසේ නොවන බව පෙනෙන්නට තිබේ. ඒ වෙනුවට සිදුවෙමින් පවතින්නේ ඊට ප්‍රතිවිරුද්ධ දෙයයි. යුරෝපය එක්සත් ජනපදයේ 'විධිමත් මිතුරෙකු' වුවද, එය නොසලකා, ඔවුන් අතර වෙනස්කම් ඇති බවත් එකී වෙනස්කම් තවදුරටත් තිරය පිටුපස සාකච්ඡා වන දෙයක් නොවී එළිපිටම ප්‍රකාශ වන දෙයක් බවට පත් වී ඇති බවත් පෙනෙන්නට තිබේ.

ඉතාම මෑතකදී යුරෝපයේ ප්‍රධාන එක්සත් ජනපද සහයක රටවල් සහ ජපානය රුසියාවට කෙරෙන G7 රටවල සියලු අපනයනය තහනම් කිරීමේ යෝජනාවට විරුද්ධ විය. එකී තහනම ක්‍රියාත්මක වූවා නම් දැනටමත් ආර්ථික අර්බුදයේ ගිලෙමින් පවතින බොහෝ රටවලට එහි අහිතකර ප්‍රතිඵලවලට මුහුණ දීමට සිදු වීමට ඉඩ තිබුණි. එය ක්‍රියාත්මක කළේ නම් රුසියාව අනතුරු අඟවා තිබුණේ යුක්‍රේන ධාන්‍ය අපනයනය ගිවිසුම අවසන් කරන බවටය. එසේ වූවා නම් එය යුරෝපීය රටවල පමණක් නොව මැදපෙරදිග සහ අප්‍රිකානු රටවලටද විනාශකාරී බලපෑමක් ඇති කිරීමට ඉඩ තිබුණි. යුක්රේන යුද්ධය තවදුරටත් තීව්‍ර කිරීමට එය හේතුවක් වන්නට ඉඩ තිබුණි.

එක්සත් ජනපදයේ වුවමනාව මත ඇවිලුණු යුක්‍රේන රුසියා යුද්ධයෙන් දැනටමත් වැඩිපුර පීඩා විඳින්නේ යුරෝපයයි. යුද්ධය නිසා සිදුවන දේපළ විනාශය, සරණාගත ගැටලුවලට අමතරව යුරෝපය පුරා බලශක්ති අර්බුදයක් ඇති කිරීමටත් උද්ධමනය ඉහළ දැමීමටත් එය හේතු වී තිබේ. මේ නිසා දැවැන්ත ප්‍රාග්ධනයන් යුරෝපය මඟහැර එක්සත් ජනපදය කරා යාමට පටන් ගෙන ඇත. දිගින් දිගටම එසේ වුවහොත් යුරෝපයේ ඉතිරි වනු ඇත්තේ සොච්චම් කර්මාන්තයන් ප්‍රමාණයක් පමණි.

ප්‍රංශ ජනාධිපති මැක්‍රෝන් මේ වන විට චීනයේ සහායද ඇතිව යුක්‍රේන රුසියා යුද්ධයට සාකච්ඡාමය විසඳුමක් සෙවීමට මැදිහත් වී සිටී. ඔහුගේ එකී උත්සාහයට අනෙකුත් යුරෝපා රටවලින් යහපත් ප්‍රතිචාර ලැබෙමින් පවතී. පසුගියදා ඉතාලියේ ආරක්ෂක ඇමති එකී උත්සාහයන්ට යහපත් ප්‍රතිචාර දක්වමින් ප්‍රකාශ කළේ චීනය එහිදී අතරමැදි කාර්යභාරයක් ඉටු කළ යුතු බවය.

2022 වසරේදී චීනය එක්සත් ජනපදය අභිබවමින් යුරෝපයේ ප්‍රධානතම වෙළෙඳ සහකරු බවට පත්විය. 2023 මාර්තු මාසයේ දී ස්පාඤ්ඤ ජනාධිපති ප්‍රකාශ කළේ චීනය හා යුරෝපය වෙන් කළ නොහැකි ආර්ථික සහකරුවන් බවය. උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයේද (NATO) සාමාජික රටක් වන ප්‍රංශයේ ජනාධිපති මැක්‍රෝන් චීන සංචාරයේදී ප්‍රකාශ කර සිටියේ යුරෝපය එක්සත් ජනපදයේ යටත් රාජ්‍යයක් නොවන බවත් යුරෝපීය විදේශීය ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේදී උපක්‍රමික ස්වාධීනත්වය පිළිබඳ සිතා බැලිය යුතු බවත්ය. ඒ නිසා එක්සත් ජනපදය හා චීනය අතර ගැටුමට යුරෝපය හසු නොවිය යුතු බවත්ය. එක්සත් ජනපදය මැක්‍රෝන්ගේ මෙම ප්‍රකාශය එතරම් බරපතළ ප්‍රකාශයක් ලෙස නොසලකන බව පෙන්නුවද මැක්‍රෝන් දිගින් දිගටම සිටියේ එක්සත් ජනපදය ස්ථාවරයේ නොවේ. විශේෂයෙන්ම රුසියාව සම්බන්ධ ප්‍රශ්නයේදී ඔහු එක්සත් ජනපදයට එරෙහි ස්ථාවරයක් නියෝජනය කළේය.

**මෙම වර්ධනයන් විසින් පෙන්නුම් කරන්නේ යුරෝපය වඩවඩාත් එක්සත් ජනපද වුවමනාවන් නියෝජනයෙන් ඈත් වී ස්වාධීන යුරෝපයක් කරා ගමන් කරමින් සිටින බවය. විශේෂයෙන්ම චීනය හා රුසියාව සම්බන්ධ ප්‍රතිපත්තියේදී ඔවුන් තවදුරටත් එක්සත් ජනපද උගුලට හසු නොවී තමන්ට වඩාත් වාසිදායක ක්‍රියාමාර්ග කරා පිවිසීමට ඉඩ ඇති බවය. මේ පිළිබඳ අදහස් දක්වන විචාරකයන් හෙන්රි කීසිංගර්ගේ පහත ප්‍රකාශය උපුටා දක්වති. "එක්සත් ජනපදයේ සතුරකු වීම භයානකය; මිතුරෙකු වීම මාරාන්තිකය."**

මේ මොහොත වන විට යුරෝපය ලෝක යුද්ධ දෙකකට පසුව යළිත් වරක් යුද වේදනාව අත්විඳිමින් සිටී. ලෝකය තුළද බල තුලනයේ වෙනසක් සලකුණු වී තිබේ. පැරණි ආරක්ෂක ව්‍යුහය බිඳ වැටී ඇත. ලෝකය තුළ බහුපාර්ශවීයත්වය තවදුරටත් සංකල්පයක් පමණක් නොව යථාර්ථයක්ද වී තිබේ. දේශපාලන ක්‍රියාකාරීත්වයේදී පමණක් නොව ආර්ථික ක්‍රියාකාරීත්වයේදීද බහුපාර්ශවීයත්වය ස්ථාපිත වී ඇත. ඒ අනුව පෙන්නුම් කෙරෙමින් තිබෙන්නේ ඉදිරියේදී යුරෝපය එක්සත් ජනපදයේ මෙවලමක් නොවී ස්වාධීන බල කේන්ද්‍රයක් බවට වර්ධනය වීමේ සලකුණුය.

## **එක්සත් ජනපදය:** සම්බාධක බලපෑම් ගැන තොරතුරු අනාවරණයක්




එක්සත් ජනපදයේ වොෂින්ටන් නුවර පදනම් කරගනිමින් ක්‍රියාත්මක වන 'ආර්ථික හා ප්‍රතිපත්ති පර්යේෂණ සඳහා වන මධ්‍යස්ථානය' විසින් සිදුකරන ලද සමීක්ෂණයක් මගින් අනාවරණය කර ඇත්තේ ලෝක බලවතුන් විසින් නීති විරෝධීව පනවා ඇති සම්බාධක මගින් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර දී නොමැති බවත්, සම්බාධකවලට ලක් වූ රටවල ජනතාව මත විනාශකාරී ප්‍රතිඵල අත්කර දී ඇති බවත්ය.

මේ මොහොත වන විට ලෝකයේ රටවල් 54ක් කිසියම් ආකාරයක ආර්ථික සම්බාධකවලට මුහුණ දී සිටී. ඒ අතරෙන් කියුබාව, ඉරානය හා උතුරු කොරියාව වැනි රටවල් දශක ගණනාවක් තිස්සේ සම්බාධක යටතේ පවතී. සමීක්ෂණයට අනුව පසුගිය දශක හය තුළ බටහිර බලවතුන් හා ජාත්‍යන්තර සංවිධාන විසින් පනවා ඇති සම්බාධකවල වර්ධනයක් දක්නට ලැබේ. නම සිය හැට ගණන්වල එක්සත් ජනපදය, යුරෝපා සංගමය හා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පැනවූ සම්බාධකවලට මුහුණ පා සිටියේ ලෝකයේ රටවල්වලින් 4%කට වඩා අඩු ප්‍රමාණයකි. නමුත් දැන් ඒ අගය 27% දක්වා ඉහළ ගොස් තිබේ. පුද්ගලයන් හෝ ආයතන ඉලක්ක කරගත් සම්බාධක පැනවීම්ද පසුගිය කාලය තුළ ඉහළ ගොස් තිබේ. උදාහරණයක් ලෙස බැරක් ඔබාමාගේ සිට ජෝ බයිඩන්ගේ පාලනය දක්වා කාලය තුළ පනවන ලද එවැනි සම්බාධක ගණන 544 සිට 1100 දක්වා ඉහළ ගොස් තිබේ. මෙම සම්බාධක පැනවීම් අතරින් වැඩි ප්‍රමාණයක් එක්සත් ජනපදය විසින් හෝ යුරෝපා සංගමය විසින් පනවන ලද නීති විරෝධී සම්බාධක බවද අනාවරණය වී තිබේ.

## **සිරියාව:** නැවතත් අරාබි මිතුරන් අතරට



පසුගිය මැයි 19 දින සෞදි අරාබියේදී පවත්වන ලද අරාබි ලීගයේ තිස් දෙවන වාර්ෂික සමුළුවට සිරියානු ජනාධිපති බෂාර් අල් අසාද් සහභාගි විය. සිරියාව මෙම සමුළුවට සහභාගි වූයේ 2011 සිරියානු යුද්ධය ආරම්භ වීමෙන් පසු පළමු වරටය. 1945 වසරේදී අරාබි ලීගය ආරම්භ කරද්දී සිරියාවද එහි ආරම්භක සාමාජිකයකු වූ නමුත් 2011 නොවැම්බර් මාසයෙන් පසු එරට සාමාජිකත්වය අහෝසි කර දැමුණි. කලාපයේ රටවල් 22ක සාමාජිකත්වයක් ඇති අරාබි ලීගයේ මෙම සමුළුවට සිරියාව කැඳවීම වැළැක්වීමට එක්සත් ජනපදය ඇතුළු බටහිර අධිරාජ්‍යවාදී රටවල් රැසක් බලපෑම් කළද එකී ප්‍රයත්නය අසාර්ථක විය. මේ අතර මෙම වසරේ නොවැම්බර් මාසයේ දී ඩුබායි හිදී පැවැත්වෙන COP28 දේශගුණ සමුළුවට සහභාගි වන ලෙසට එක්සත් අරාබි එමීර් රාජ්‍යය සිරියාවට ආරාධනා කර තිබේ.

## **පෘතුගාලය:** හෙද හෙදියෝ විරෝධතා මඟට




මැයි දොළොස් වන දිනට යෙදී තිබුණු ජාත්‍යන්තර හෙද දිනයේදී පෘතුගාලයේ හෙද හෙදියෝ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහ වඩාත් හොඳ වැඩ පරිසරයක් සකසා දෙන ලෙසට බලකරමින් එක් දින වැඩ වර්ජනයක යෙදුනහ. එම වැඩ වර්ධනය සංවිධානය කරන ලද්දේ පෘතුගාල හෙද සංගමය සහ පෘතුගාල ප්‍රජාතන්ත්‍රවාදී හෙද සංගමය විසිනි. එදින ඔවුහු ලිස්බන්හි සෞඛ්‍ය අමාත්‍යාංශය ඉදිරිපිට විරෝධතාවකද යෙදුනහ.

## **එක්සත් ජනපදය:** රූපවාහිනී හා සිනමා තිර රචකයෝ ඓතිහාසික වැඩවර්ජනයක




එක්සත් ජනපදයේ රූපවාහිනී හා සිනමා තිර රචකයෝ මැයි දෙවන දින සිට ඓතිහාසික වැඩවර්ජනයක යෙදී සිටිති. ඇමරිකානු ලේඛක සංසදය ගිග් ආර්ථිකයේ ග්‍රහණයෙන් ලේඛන කලාව නමැති වෘත්තිය ගලවා ගැනීම සඳහා වන අරගලයක යෙදී සිටියි. ලේඛන වෘත්තියේ ස්ථායිතාව, වඩා හොඳ ගෙවීමක් හා කෘත්‍රිම බුද්ධිය භාවිතයට නීති රීති හඳුන්වා දීම ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම්ය. එහෙත් ලේඛකයන් මගින් තමන් ලබාගන්නා බිලියන ගණන් ලාභ නොසලකමින් 'මහා කලාගාරයන් හිමිකරුවන්ගේ සන්ධානය' එකී ඉල්ලීම් ලබාදීම ප්‍රතික්ෂේප කර තිබේ. එසේ වුවද එක්සත් ජනපදයේ විනෝද කර්මාන්තය තුළ වන ප්‍රධාන වෘත්තිය සමිති සහ ඊට පරිබාහිරව ඇති අනිකුත් වෘත්තිය සමිති රූපවාහිනි හා සිනමා තිර රචකයන්ගේ වෘත්තීය අරගලයට සහාය පළකර සිටී.

# IMF උගුල
# ණය ප්‍රතිව්‍යුහගතකරණය විසඳුමද? ප්‍රශ්නයද?

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාවට ලබාදෙන ඩොලර් බිලියන 2.9ක විස්තීරණ ණය පහසුකම ලංකාවට වසර 75කට පසුව ලැබුණු සිතූ පැතූ දේ දෙන කප්රුක ලෙසට පැවැති සංවාදය දැන් අවසන් වෙමින් තිබේ. ඒ වෙනුවට දැන් මාතෘකාව බවට පත්ව ඇත්තේ ණය ප්‍රතිව්‍යුහගත කරණය (Debt Restructuring) සහ දේශීය ණය ප්‍රශස්තකරණයයි. (Domestic Debt Optimisation)

රටේ ආර්ථිකය ණය බරින් ගලවා ගැනීම පසෙක තබා රනිල් වික්‍රමසිංහගේ සදාචාර නොවන ජනාධිපති පත්වීමට සුජාතභාවයක් ලබාදෙමින්, පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන මැතිවරණය කල්දැමීමේ අනීතික ප්‍රජාතන්ත්‍රවිරෝධී ක්‍රියාමාර්ගයට ගොඩනැගී තිබූ ජනතා විරෝධය යටපත් කරමින්, ආණ්ඩුවේ බලය ගිලිහී යා නොදී තබා ගැනීම එකම අවශ්‍යතාවය ලෙස සලකා මූල්‍ය අරමුදල කඩිමුඩියේ ලංකාවට මැදිහත් වූ බව දැන් කාටත් හොඳින්ම පැහැදිලිය. ප්‍රතිවිරෝධයකින් තොරව බදු වැඩි කිරීමත්, පොදු දේපළ විකිණීමට අවශ්‍ය නීතිමය හා ක්‍රියාත්මක සැලසුම ක්‍රියාවට නැගීමත් මෙම වැඩසටහනේම කොටසකි. ඒ සියල්ලටම වඩා දැන් ඉදිරියට පැමිණ ඇති මාතෘකාව වී ඇත්තේ ණය ප්‍රතිව්‍යුහගතකරණයයි.



"ද්‍රව්‍යමය ජීවනයේ නිෂ්පාදන ක්‍රමය විසින් සමාජමය දේශපාලනමය හා චෛතසික ජීවනයේ ක්‍රියාදාමයන් පොදු වශයෙන් හැඩගස්වනු ලැබේ. මිනිසුන්ගේ සත්තාව නිර්ණය කෙරෙන්නේ ඔවුන්ගේ විඥානය විසින් නොවේ. ඊට ප්‍රතිකූල වශයෙන් ඔවුන්ගේ විඥානය නිර්ණය කෙරෙන්නේ ඔවුන්ගේ සමාජ සත්තාව විසිනි"


**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**01වෙළුම, 20-21 පිටු**

## ණය ප්‍රතිව්‍යුහගතකරණය යනු කුමක්ද?

2022 අවසානයට ලංකාවේ සමස්ත ණය බර ඩොලර් මිලියන 83,595කි (රු. බිලියන 30,355කි). එයින් විදේශීය ණය ඩොලර් මිලියන 41,474කි. දේශීය ණය ඩොලර් මිලියන 42,151කි (රුපියල් බිලියන 15,295කි). මෙම ණය තවදුරටත් ගෙවිය නොහැකි බව 2022 අප්‍රේල් 12 වන දින ආණ්ඩුව ප්‍රකාශයට පත් කිරීමත් සමග ලංකාව ණය ගෙවිය නොහැකි රාජ්‍යයක් ලෙස නිල ලෙස ප්‍රකාශයට පත්විය.

මූල්‍ය අරමුදල මගින් ඩොලර් බිලියන 2.9ක ණය සහනයක් ලබාදීමේදී ඉදිරිපත් කර ඇති අර්බුදයෙන් ගොඩ ඒමේ විකල්ප වැඩපිළිවෙළට අනුව ගෙවිය යුතු විදේශ ණයවලින් ඩොලර් බිලියන 14ක ණය සහනයක් (Debt Relief) ආණ්ඩුව සලසා ගත යුතුය. එය ණය ප්‍රතිව්‍යුහගතකරණය ලෙස ආණ්ඩුව හඳුන්වයි. මේ ප්‍රතිව්‍යුහගතකරණය යටතේ එක්කෝ ණය කපා හැරීමක් (Haircut) ණය කල්පිරීම කල්දාගැනීමක් (Reprofiling) හෝ කූපන් ගැලපීමක් (Coupon Adjustment) හෝ මේ ආකාර තුනේම එකතුවක් විය හැකිය. ඒ සඳහා ලංකාවේ ආණ්ඩුව, ණය හිමියන් සමග එකඟතාවයක් ඇතිකර ගත යුතුය.

විදේශ ණයවලින් ඩොලර් බිලියන 11 (ඩොලර් මිලියන 11,419ක්) නිල ද්විපාර්ශ්වීය ණය හිමියන්ය. ඒ අතර පැරිස් ක්ලබ් ආධාර කණ්ඩායමට ලංකාව ඩොලර් බිලියන 4.7ක් ණය ගෙවිය යුතුය. එයින් ප්‍රධාන ණය හිමියා ඩොලර් බිලියන 2.8ක් හිමි ජපානයයි. පැරිස් ආධාර කණ්ඩායම නොවන රටවල් අතර ප්‍රධාන රට චීනයයි. එම ප්‍රමාණය ඩොලර් බිලියන 4.4ක් වන අතර, ඉන්දියාවට ඩොලර් බිලියන 1.8ක් ලංකාව ණය ගෙවිය යුතුයි. ණය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ විදේශ ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුකරණයට ජපානය, චීනය හා ඉන්දියාව සමග ඉහත කුමන ආකාරයකින් හෝ ඉදිරි ණය ගෙවීම කල්දා ගැනීමේ එකඟතාවයකට ලංකාව පැමිණිය යුතු වේ.




2003 වසරේදී සම්පූර්ණ කරන ණය පියවීමේ හා ලබා ගැනීමේ සැලැස්මට අනුව හා මූල්‍ය අරමුදල ඉදිරිපත් කරන සැලැස්මට අනුව, ආණ්ඩුවේ අර්බුදයට විසඳුමක් ලබා ගැනීම සඳහා 2023 වසරේ දළ විදේශ මූල්‍ය සපයා ගැනීමේ අවශ්‍යතාව (Gross external financial needs) ඩොලර් බිලියන 6.6කි (ඩො.මි. 6636කි). එයින් මිලියන 2109ක් මේ වසරේ විදේශීය රටවලින් හෝ බහුපාර්ශ්වීය ආයතනවලින් ලබා ගත යුතුය. විදේශීය ආයතන මගින් තවත් මිලියන 950ක් ලබා ගත යුතු අතර පෞද්ගලික අංශයද ඩොලර් මිලියන 900ක් සපයා ගැනීමට අපේක්ෂිතය. ඒ සියලු ආකාරයෙන් මූල්‍ය සම්පාදනයෙන් අනතුරුව ඇතිවන හිඟය වන ඩොලර් මිලියන 4939ක් සපුරා ගනු ලබන්නේ විකල්ප මූල්‍ය (Exception financial gap) ක්‍රමයන් මගිනි. එයින් ඩො.මි. 663ක් ලබා දෙන්නේ මූල්‍ය අරමුදල මගිනි. (එනම් ඩො.බි. 2.9ක විස්තීරණ ණය ප්‍රමාණයට 2023 වසරේ අදාළ කොටසයි) ජාත්‍යන්තර මූල්‍ය සමායතනය තවත් ඩොලර් මිලියන 900ක් ලබාදීමට නියමිතය.

එයින් අනතුරුවත් ඇතිවන විදේශ මූල්‍ය හිඟය වන ඩොලර් බිලියන 3.3ක් (ඩොලර් මිලියන 3376ක්) ණය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ ණය සහනයක් ආණ්ඩුව විසින් සලසා ගත යුතුයි. විදේශ ණය කපා හැරීම ලෙස සාමාන්‍යකරණය වී ඇත්තේ මේ ප්‍රමාණයයි. මූල්‍ය අරමුදල වසර 04ක් තුළ ඩොලර් බිලියන 2.9ක ණයක් පොලී පදනම යටතේ දෙනවිට අපි රටක් ලෙස ණය ලබාදී ඇති ණය හිමියන් එකඟ කරගෙන 2028 දක්වා කාලය තුළ වාර්ෂිකව බිලියන 3.3, 3.6, 2.2 ආදී වශයෙන් මෙම සහනයන් ලබාගත යුතුව ඇත. එම ප්‍රතිව්‍යුහගතකරණයක් සිදුකර ගැනීමට ආණ්ඩුව අපොහොසත් වීම යනු, එම විදේශ මූල්‍ය හිඟය ඊළඟ වසරට මාරු වීමයි. අර්බුදය ලබන වසරේ හිඟයට එකතු වන බවයි.

## දේශීය ණය ප්‍රශස්තකරණය

ආණ්ඩුව මූල්‍ය අරමුදලේ ණය අනුමත කර ගන්නා අවස්ථාවේදී රටට, ජනතාවට අවධාරණය කරන ලද්දේ විදේශ ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳව මිස ආණ්ඩුවේ දේශීය ණය පිළිබඳව නොවේ. නමුත් දැන් මතුවී ඇති ප්‍රධාන ප්‍රශ්නය වී ඇත්තේ විදේශීය ණය සඳහා සහනයක් ලබා ගැනීමට නම්, පූර්ව අවශ්‍යතාවයක් ලෙස, දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය කළ යුතු බවට මූල්‍ය අරමුදලේ ප්‍රධානීන් කොන්දේසි පනවා තිබෙන බව කරළියට පැමිණීමයි.

ආණ්ඩුවේ දේශීය ණය පිළිබඳව මූල්‍ය අරමුදලේ වාර්තාවේ දක්වා ඇති පරිදි එම ප්‍රමාණය ඩොලර් බිලියන 42ක් නැතහොත් රුපියල් බිලියන 15,595කි. එයින් රුලියල් බිලියන 13,817ක්ම දේශීය මුදල් ඒකකවලින් ආණ්ඩුව ලබාගත් ණය වන අතර, විදේශීය මූල්‍ය ඒකකවලින් ලබාගත් රුපියල් බිලියන 1478ක් ද අයත්ය. දේශීය මූල්‍ය ඒකක ණය ලෙස භාණ්ඩාගාර බිල්පත් නිකුතු මගින් ලබාගෙන ඇති ප්‍රමාණය රුපියල් බිලියන 4126ක් වන අතර භාණ්ඩාගාර බැඳුම්කර මගින් සපයාගෙන ඇති ප්‍රමාණය රුපියල් බිලියන 8722කි. බැංකු ණය ලෙස බිලියන 709ක් සපයාගෙන ඇත.

ඉහත භාණ්ඩාගාර බිල්පත් නිකුතුව මගින් ණය ලබාගත හැකි ආකාර කිහිපයක් වේ. ඉන් ප්‍රධානම වන්නේ ආණ්ඩුව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර මහ බැංකුවෙන් ණයක් ලබාගැනීමයි. එවිට සිදුවන්නේ, මහ බැංකුව එම භාණ්ඩාගාර බිල්පත් තමන්ම වත්කමක් සේ ගිණුම්වල සටහන් කර, මුදල් අලුතින් අච්චු ගසා ආණ්ඩුවට ණයක් දීමයි. දැන් ආණ්ඩුවට ණය ප්‍රශස්තකරණය යටතේ එම භාණ්ඩාගාර බිල්පත් මගින් ලබාගත් ණය මහ බැංකුවට නොගෙවා කපා හැරිය හැකියි.

නමුත්, ආණ්ඩුව අර්ථසාධක අරමුදලෙන් ණය ලබාගෙන ඇත්නම්, ඒවා කපා හැරීමට ආණ්ඩුවට ඇති අයිතිය ප්‍රශ්න සහගතය! ආණ්ඩුව මහ බැංකුව ලවා ණයක් අලුතින් ලබා ගන්නා විට එය මහා බැංකුවට වත්කමක් මෙන්ම භාණ්ඩාගාරයට වගකීමකි. ආණ්ඩුවේ වගකීම මහ බැංකුවේ වත්කම ඉවත් කිරීමෙන් හිලව් කළ හැකිය. ඒ ප්‍රමාණයට දෙපැත්තෙන්ම කපා ඉවත්කර ගිණුමය ලෙස ණය අඩුකර පෙන්විය හැකිය.

> එම ණය හෝ ආණ්ඩුවෙන් ගෙවිය යුතු පොලී ආදායම ආණ්ඩුවේ ණය ප්‍රශස්තකරණය යටතේ කපා හළ හොත්, එහි පාඩුව ඍජුවම දැරීමට සිදුවන්නේ ප්‍රතිලාභීන් වන සේවකයින් හා බැංකුවල තැන්පත්කරුවන් වන මහජනතාවටය. ඒ නිසා ආණ්ඩුවේ ණය කැපීමේ යෝජනාවෙන් බැට කෑමට දැන් ලක්වීමට සිදුව ඇත්තේ අවසානයේදී ණයවලින් හොරා කා යටිමඩි ගැසුවන්ට නොව පොදු මහජනතාවටය.

නමුත් අර්ථසාධකයේ ඇති මුදල් මේ රටේ වැඩකරන ජනතාවගේය. එම මුදල් මහා බැංකුවට හෝ ආණ්ඩුවේ භාණ්ඩාගාරයට අයිති නැත. මහා බැංකුව අර්ථසාධක අරමුදලේ භාරකරු මිස අයිතිකරු නොවේ. අර්ථසාධක අරමුදල භාණ්ඩාගාර බැඳුම්කරවල හෝ බිල්පත්වල ආයෝජන කර ඇත්තේ ඒ සඳහා ලැබෙන පොලී ආදායම අරමුදලේ ප්‍රතිලාභියන් වන ලක්ෂ 26ක් පමණ වන සාමාජිකයන්ට බෙදී යන ලෙසටයි.

2021.12.31 දිනට අර්ථසාධක අරමුදලේ මුදල්වලින් රුපියල් බිලියන 2957ක් ආයෝජන කර තිබුණේ ආණ්ඩුවට ණය දීම ලෙසය. සේවක භාර අරමුදලේ රුපියල් බිලියන 467ක්ද, ශ්‍රී ලංකා රක්ෂණ අරමුදලේ රුපියල් බිලියන 220ක්ද මෙම ආයෝජන අතර විය.

මීට අමතරව බැංකු ලෙස ලංකා බැංකුව මිලියන 1566ක් ලෙස ආණ්ඩුවට ණය දී ඇති ප්‍රධානම රාජ්‍ය බැංකුව වන අතර, ජාතික ඉතිරි කිරීම බැංකුව රුපියල් මිලියන 961ක්ද, මහජන බැංකුව රුපියල් මිලියන 906ක්ද මෙලෙස ආණ්ඩුවට ණය දී ඇත. ආසන්න ලෙස රුපියල් මිලියන 13,000ක් වන මහ බැංකුවේ දේශීය ණය තොගයෙන් 79%ක්ම (රුපියල් මිලියන 10,112ක්ම) සමන්විත වන්නේ සේවක අර්ථ සාධක අරමුදල ඇතුළු අරමුදල් සහ දේශීය රාජ්‍ය බැංකු ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල ආයෝජන හරහා ලබාදී ඇති ණය ප්‍රමාණයන් වේ. එම ණය හෝ ආණ්ඩුවෙන් ගෙවිය යුතු පොලී ආදායම ආණ්ඩුවේ ණය ප්‍රශස්තකරණය යටතේ කපා හළ හොත්, එහි පාඩුව ඍජුවම දැරීමට සිදුවන්නේ ප්‍රතිලාභීන් වන සේවකයින් හා බැංකුවල තැන්පත්කරුවන් වන මහජනතාවටය. ඒ නිසා ආණ්ඩුවේ ණය කැපීමේ යෝජනාවෙන් බැට කෑමට දැන් ලක්වීමට සිදුව ඇත්තේ අවසානයේදී ණයවලින් හොරා කා යටිමඩි ගැසූවන්ට නොව පොදු මහජනතාවටය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාවේ අර්බුදයට විසඳුම් ලෙස ඉදිරිපත් කරන බොහෝ යෝජනා, විසඳුමක් වෙනුවට අලුත් අර්බුද රැසක් ආරම්භ කර ඇත්තේ මේ ලෙසය. ජාතික සම්පත් විකිණීමේ යෝඅජනා මෙන්ම අර්ථසාධක අරමුදල් අහෝසි වීම පිළිබඳව අලුත් අර්බුදයද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය විසඳුම් මගින් බිහි කළ අලුත් අර්බුදයන්ය.

ඒ නිසා ධනපති පාලක පංතිය ආරක්ෂා කරමින් ජනතාවට අලුත් අර්බුද ඇති කිරිම හැර මූල්‍ය අරමුදල හෝ ආණ්ඩුව වත්මන් අර්බුදයෙන් දශමයක්වත් රට ගොඩගනීවි යැයි ජනතාවට විශ්වාසයක් තැබිය නොහැකිය.



# යකඩ මල්ලට ගුල්ලො ගැහුවානම් හාල් මල්ල ගැන කවර කතාද?

මට කුඩා කාලයේ ගමේ පාරේ දුවපු බස් එක සිහිවේ. ඒ බස් එක සෙනඟ නැතුව ගියත්, ගියේ එක පැත්තකට ඇලවෙලාය. කොයි වෙලාවේ ලෙඩක් දී අතර මඟ නතර වේ දැයි නිනව්වක්ද නැත. එයට කලක් වෙලාවක් තිබුණේ නැත. ගමේ කඩේ ගාව පමණක් නොව, පාලම, බෝක්කුව ළඟ පවා නතර කරගෙන වරු ගණන් ළතවෙන එක මේ බස් එකේ පුරුද්දය. බස් එක පණ අදිමින් බඩගාන සද්දය බස් එකේ අබලන් බව ගමටම කියාපායි. ඒ විතරක් නොවේ බස් එක කැඩුණු දාට ගමේ ළමුන්ගේ ඉස්කෝලේ ගමන ද, දැන උගතුන්ගේ කන්තෝරු ගමනද, එළවළු පළා ටික විකුණා ගන්නට පොළට යන වෙළෙන්දන්ගේ ගමනද නතර වේ. එහෙත් මේ බස් එකේ ගමන් කරන ගමේ මිනිස්සුන්ට ගමනක් යන්නට ක්‍රමයක් තිබුණේ ද නැත. අමාරුවෙන් පයින් දාඩිය පෙරාගෙන හති දමමින් ගිය ටික දෙනෙකු හැර ගමේ අනෙක් අයට බස් එක නැතිදාට ගමනක් තිබුණේ ද නැත.

රටේ ආර්ථිකය ද, දැන් අපේ බස් එක වගේ යැයි හැඟේ. දැන් රට බංකොලොත්ය; දුප්පත්ය. ආර්ථිකය අබලන් බව වටින් පිටින් ඇහෙන සද්දවලින්ද දැනේ. කොයි වෙලාවේ මඟ නතර වේ දැයි සැක සහිතය. බදු බර ද ඉහළ දමා ඇත. බදු ආදායමෙන් සැලකිය යුතු කොටසක් උසුලන්නේ වැට් (VAT) බද්ද වන අතර, එය වක්‍ර බද්දක් ලෙස සියලු ජනතාව විසින් ගෙවනු ලබයි. බෙහෙත් පෙත්තෙන් හාල් කිලෝවෙන්, පාන් ගෙඩියෙන් ආදී සියලු ගෙවීම්වලින් ජනතාව බදු ගෙවමින් හිඳියි. සියල්ල අපේ ඇඟට දැනෙමින් පවතියි.

මහා පරිමාණ ආර්ථික මර්මස්ථාන බිඳ වැටී සහ වැටෙමින් ඇති අතර, මේ ආර්ථික පීඩනය වඩ වඩාත් දැනෙන්නේ මධ්‍යම පාංතික වැටුප් ලබන ශ්‍රමිකයාට සහ දෛනික ආදායමක් ලබන අවිධිමත් රැකියාවල නියුතු ජනතාවටය. Sri Lanka Development Update October 2022 අනුව, 2021 ලංකාවේ දුප්පත්කම 13.1%කි. එය 2022 දී 25.6%කි. ඒ අනුව ලංකාවේ ජනගහනයෙන් හතරෙන් එකක් දරිද්‍රතා රේඛාවෙන් පහළ බව පෙනේ. මධ්‍යම පාංතික දුප්පත්කම 5% සිට 15% දක්වාද 2022 වසරේ තුන් ගුණයකින් වැඩිවී ඇති බව ලෝක බැංකුව පවසයි.

මේ අනුව මධ්‍යම පාංතික හා අවිධිමත් රැකියාවල නියුතු ජනතාවට ආර්ථික පීඩනය කෙසේ බලපා ඇති දැයි හඳුනා ගැනීමට හැකිවේ. දෛනික ආදායමක් ලබන අවිධිමත් රැකියාවල නියුතු ජනතාවගෙන් සැලකිය යුතු පිරිසක් කාන්තාවෝ වෙති. ඒ අතර කුඩා පරිමාණයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කාන්තාවන්ද බහුලය. මහමඟට බට විට මෙවැනි සුළු ව්‍යාපාරයක් කර එදිනෙදා ජීවිතය පවත්වාගෙන යන ගැහැනුන් ඕනෑ තරම් දැක ගැනීමට හැකිය. වෙනදා කොළ කැඳ විකිණූ මව්වරුන්ට හාල්, පොල් හා කොළ මිටියද ගිනි ගණන් නිසා වෙනදාම මිලට කොළ කැඳ වීදුරුව විකිණීමට නොහැකිය. මිල වැඩි කළ පසු කොළ කැඳ බීමට එන පාරිභෝගිකයන් අඩුවීම නිසා දැන් කොළ කැඳ බිස්නස් එක වෙනදා තරම් සරු නැත.

රෙදි මැසීම ජීවනෝපාය කර ගනිමින් ජීවත් වූ කාන්තාවන්ගේ ජීවිතයටද අද කණ කොකා හඬා ඇත. විශේෂයෙන් පමුණුවේ රෙදි වෙළෙඳාම පහළ වැටී ඇති තත්වයක් තුළ පමුණුවට නිමි ඇඳුම් සැපයූ කාන්තාවන්ගේ ආදායම් මාර්ග සම්පූර්ණයෙන්ම නතර වී තිබේ. අනෙකුත් පළාත්වලද කුඩා පරිමාණ මැහුම් ව්‍යාපාරවල තත්වය මෙබඳුමය.

කාන්තාවන් සිදුකළ ආර්ථික කටයුතු අතර මල් පැල විකිණීම, රටකජු විකිණීම, ජෑම්, චට්නි, අච්චාරු, විකණීම, යෝගම්, වටලප්පම් විකිණීම, කෑම පාර්සල් විකිණීම, මෙන්ම සුළු කේටරින් ව්‍යාපරද රූපලාවණ්‍යය ආයතනද දක්නට ලැබුණි. නමුත් ආර්ථිකය කඩා වැටීම තුළ මේ සියලු ක්ෂුද්‍ර ව්‍යාපාර බිඳ වැටී ඇත. යකඩ මල්ලට ගුල්ලේ ගැසූ පසු හාල් මල්ල යහතින් පවතී යැයි සිතීම උගහට බව අප කියන්නේ එබැවිනි.

එක් අතෙකින් කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වයට මෙය මරු පහරකි. තමන් කැමති දෙයක් ගන්නට, සැලෝන් එකකට යන්නට, නිවසට බඩුවක් මුට්ටුවක් ගන්නට බොහෝ දුප්පත් කාන්තාවන්ට තිබූ අවම හැකියාව පවා දැන් දුර්වල වී ගොසිනි. තමන් යෙදුණු ආර්ථික කටයුත්ත අහිමි වීමෙන් ඇයට තම සැමියා මත, යැපෙන්නට සිදුවීමෙන් සිදුවන මානසික පීඩාවද නොසලකා හැරිය නොහැකිය. එසේම පවුලේ ආර්ථිකයට ඇගෙන් ලද ශක්තිය නොලැබීමෙන් සිදුවන බලපෑමද අතිවිශාල වේ. දරුවන්ගේ ටියුෂන් වියදම, අමතර කෑම බීම හා ඉඳහිටක හෝ කැමති දෙයක් මිලදී ගන්නට තිබූ හැකියාව, බැංකු ණය වාරික හා ලයිට් බිල් වතුර බිල් ගෙවීම ආදිය දැන් ඇහිරී ගොසිනි. ක්ෂුද්‍ර මූල්‍ය ණය ගෙවීමට නොහැකි වීමද මෙහි තවත් ඛේදවාචකයක් බව අමුතුවෙන් කිව යුතු නොවේ.

මෙය මේ වන විට ඔබ අත්විඳිමින් හිඳිනවාට සැක නැත. ඔබේ අසල්වැසි කාන්තාවන් මේ තත්වයන්ට මුහුණ දී හිඳිනවා ඇත. නමුත් මෙයට විසඳුමක් ලැබෙනු ඇතැයි විශ්වාස කළ නොහැකිය. ෂඵත සිහින පෙන්වා රට යථා තත්වයට පත්වෙන බව පෙන්වන්නට තැත් කරන රනිල්ගේ ආණ්ඩුව නොකියන කතා බොහොමයක් ඇති නමුත් මේ ආර්ථික අර්බුදය කිසි ලෙසකින් වත් සැඟවිය හැකි නොවේ. තවදුරටත් සුරංගනා සිහින පෙන්වන්නට හදන ආණ්ඩුවේ ගැටලුවලට කාන්තාවන් ලෙස අප හසුවිය යුතුද නොවේ.

හැම පැත්තෙන්ම ආර්ථික අර්බුදය නිසා බැටකන කාන්තාවන්ගේ පීඩාවට පිළිතුරක් ලබාදිය හැකි පාලනයක් වෙනුවෙන් බලාපොරොත්තු සහගත වීම සහ ඒ වෙනුවෙන් කැපවීම හැර අන්කිසිවක් නොවන බවද අප වටහා ගත යුතුය.



# කාන්තාවන්ගේ පීඩාවට පිළිතුරක් ලැබෙන පාලනයක් ගොඩනගමු!

**ධම්මිකා සෝමරත්න සහෝදරිය**
**විධායක සභික - අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය**
**කලාප සංවිධායිකා - අන්තර් වෙළඳ කලාප සේවක සංගමය**

අද රටේ පවතින්නේ ඉතිහාසයේ සමාජය මුහුණ දුන් දරුණු ආර්ථික, දේශපාලන හා සමාජීය, සංස්කෘතික අර්බුදයක ගිලෙමින්. මේ වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වන, දූෂිත දේශපාලනයේ අනිවාර්ය අසාර්ථකභාවය නිසා සිදුවන්නක්. මේ නිසා ආයතන වසා දැමීම, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයන් ඉවත් කිරීම, අතිකාල දීමනා නොගෙවීම තුළ ඔවුනට තම ආර්ථික මට්ටම පවත්වා ගත නොහැකි තත්වයක් උදාවෙලා.

මේ නිසා කලාප ආශ්‍රිතව පවත්වාගෙන ගිය කුඩා තේ කඩ, එළවළු කඩ, මසා නිමකරන ලද ඇඳුම්, රූපලාවන්‍ය ආදී සුළු ව්‍යාපාර පවත්වාගෙ ගිය කාන්තාවන් බහුතරයක් අසරණභාවයට පත් වෙලා.

මේ නිසා පෝෂ්‍යදායී ආහාර වේලක්, පාසල් පොත පත්, ඇඳුම්-පැළඳුම්, සපත්තු-සෙරෙප්පු තම දරුවන්ට ලබාදීමට නොහැකිව, ඒ වගේම අවශ්‍ය බෙහෙත් ටික ගන්න, අනෙකුත් වුවමනාවන් සපුරා ගැනීමට නොහැකිව ලතවෙමින් සිටින කාන්තාවන් වෙළඳ කලාපය ආශ්‍රිතව දැන් බහුලව දකින්න ලැබෙනවා.

මේ තත්වය වෙළඳ කලාපය ආශ්‍රිතව පමණක් නොවෙයි රට පුරාම සුළු කර්මාන්තවල නියුතු වූ කාන්තාවන්ගේ තත්වය බවට පත්වෙලා.

මම කලින් සඳහන් කළා වගේ මේ තත්වය වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වන, දූෂිත දේශපාලනයේ අනිවාර්ය ප්‍රතිඵලයක්. එනිසා මේ දූෂිත දේශපාලයට තිත තබා ජනතාවාදී පාලනයක් ගොඩනැගීම සඳහා කාන්තාවන් විදියට අපි පෙළගැසිය යුතුව තිබෙනවා.

# නොමළ ගෙයකින් අබ හොයන එක ගැහැනු දන් ඇත නවත්වා

බිම වැටුණු බොල් පවුරු පාමුල
මහමෙරයි හිත රවට්ටා
නොදන්නා තව්තිසාවක නෙත්
නිලංකාරව සතප්පා
කදෝ පැණියන් මුලා කළ දා
ගිනි පෙනෙල්ලෙන් කොනිත්තා
නෙළා ගෙන ආ පළා මිටියත්
මුවන් දැක මග විසික්කා

පිපාසාවට මිරිඟුවක් දැක
හති වැටී මග වරද්දා
දරු පැටවු ටික තුරුල් කරගෙන
පටාචාරත් ඇවිද්දා
තිස් පැයේ නිදිවරා වෙහෙසී
සැනසුමක් ළඟ නොරන්දා
හිරුට කළියෙන් අඳුර නැඟුනයි
පුරා සඳවත පරද්දා

සලඹ විසිකළ පතිනි මවුනට
හීනෙකින්වත් නොරිද්දා
දෙවොල පාමුල විසුළ සිහිනෙක
ජීවිතය යළි පුරුද්දා
හාමතින් ඉකිබිඳින දෑසක
හංස ගීතය පරද්දා
නොමළ ගෙයකින් අබ හොයන එක
ගැහැනු දැන් ඇත නවත්තා

# ලොවට නොදැනී පෙලෙන තුර්කි කාන්තාව

තුර්කියේ ජනගහනය මිලියන 85 කට ආසන්න වන අතර නිල වශයෙන් නම් අනාගාමික රාජ්‍යයකි. එනමුත් බලයේ සිටින ජනාධිපති රෙසිප් තායිප් එර්දොගාන් ගේ පක්ෂය ගතානුගතික මුස්ලිම් මූලයක් සහිත පක්ෂයකි. එබැවින් මෙම පාලනය තුල ක්‍රියාත්මක ප්‍රතිපත්ති හේතුවෙන් කාන්තාවන්ට ප්‍රගතියක් අත් කර දීම වෙනුවට කාන්තාවන්ගේ තත්ත්වය පහතට වැටීම සිදුවී ඇත.

2021 වර්ෂයේ එර්දොගාන් විසින් තිරණයක් ගනිමින් තුර්කිය කාන්තාවන්ට එරෙහිව සිදු කෙරෙන ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව සටන් කිරීමේ යුරෝපියානු සම්මුතියෙන් ඉවත් කරවා ගැනීමට කටයුතු කළ අතර එයට හේතු ලෙස ඉදිරිපත් කරන ලද්දේ එම සම්මුතිය විසින් පවුල් වල ගුණාත්මකභාවය නැතිකරන අතර සමරිසි ප්‍රජාවගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරන බව දක්වමිනි. පසුගිය වසර තුළ පමණක් තුර්කිය තුළ කාන්තාවන් 397 කට නොඅඩු ප්‍රමාණයක් ඝාතනයට ලක්ව ඇත. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන, ජනතාව දැනුවත් කරන සහ විරෝධතාවය පළකරන කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම් නීතිය සහ සදාචාරයට එරෙහිව කටයුතු කරන කණ්ඩායම් වශයෙන් හංවඩු ගැසීමටද ඔවුන්ට එරෙහිව නඩු පැවරීමද වර්තමානයේ සිදුවේ.

මෙම මාසයේ තුර්කියේ ජනාධිපතිවරණය පැවැත්වෙන අතර පළමු වටයේ ඡන්ද විමසීමෙන් එර්දොගාන් ඉදිරියට පැමිණයද 50% කට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගැනීමට නොහැකි වීමේ පදනම මත මේ වන විට දෙවන වටයේ ඡන්ද විමසීම පැවැත්වීමට නියමිතව ඇත. කෙසේ නමුත් මෙවරද ඔහුගේ පක්ෂය නැවත බලයට පත්වීම මත එරට කාන්තාවන් සහ කාන්තාවන් වෙනුවෙන් ක්‍රියාකාරී වන කණ්ඩායම් මත එල්ල වී ඇති බාධා තවදුරටත් වර්ධනය වනු ඇත.

# හිංසනයට එරෙහිව මල්ලවපොර

මේ වන විට සති කිහිපයක් තිස්සේ ඉන්දියාවේ දක්ෂතම මල්ලවපොර ක්‍රීඩක ක්‍රීඩිකාවෝ පිරිසක් දිල්ලියේ මාර්ගයක අයිනේ කූඩාරම්වල ජීවත් වෙමින් විරෝධතාවයක නිරත වෙති. මෙම කණ්ඩායම තුළ ඔලිම්පික් පදක්කම් ශූරයෝද ආසියානු ක්‍රීඩා ශූරයෝද වෙති. ඔවුන් මෙම විරෝධතාවයෙහි යෙදෙමින් බලකරන්නේ ඉන්දියානු මල්ලවපොර සම්මේලනයේ සභාපති බ්‍රිජ් භූෂාන් ශරන් සිංග්ට එරෙහිවයි.

ඔවුන් චෝදනා කරන්නේ කාන්තා මල්ලවපොර ක්‍රීඩිකාවන් හත් දෙනෙකු විසින් ලිංගික හිංසනය සම්බන්ධයෙන් චෝදනා කර ඇති මෙම නිලධාරියාට එරෙහිව පියවර ගැනීම ඉන්දියානු රජය විසින් මග හැර ඇති බවයි. මොහු පාලක පක්ෂය වන භාරතීය ජනතා පක්ෂයේ ප්‍රබල සාමාජිකයෙකු ද වෙයි. මෙම විරෝධතාවයට මෙම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පවුල්වල සාමාජිකයින්ද, ගොවීන් වැනි විවිධ වෘත්තීන් නියෝජනය කරන පුද්ගලයින්ගේද සහය ලැබෙන බව වාර්තා වෙයි. කාන්තාවන් ගේ ආරක්ෂාව පිළිබඳව ක්‍රියාත්මක වන අරගලයක් වශයෙන් ඉන්දියාව තුළ අවධානය දිනාගැනීමට මෙම අරගලය සමත්ව ඇත. මූලික වශයෙන් මෙම විරෝධතා ජනවාරි මාසයේ ආරම්භ වුවත් තාවකාලිකව නවත්වන ලද්දේ විනය පරීක්ෂණයක් සිදුකිරීම යන පොරොන්දුව මත. එහි ප්‍රතිඵලයක් නොමැති වීම හේතුවෙන් මෙම විරෝධතාවය ආරම්භ කළ බවත් අදාළ නිලධාරියාට දඬුවම් ලබාදෙන තුරු විරෝධතාවය පවත්වාගෙන යාමට අපේක්ෂා කරන බවත් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ප්‍රකාශ කර සිටිති.

# ක්‍රීඩාව, විනෝදය හා මානව ගරුත්වය

අප ජීවත්වන ධනවාදී ක්‍රමය අර්බුදයට ගොස් පිරිහී තිබේ. එය පිරිහීමට ලක්ව තිබෙන්නේ ආර්ථික හා දේශපාලන වශයෙන් පමණක් නොවේ. සංස්කෘතික වශයෙන්ද පිරිහී තිබේ. එය ස්වභාවිකය. මන්ද සමාජ ක්‍රමයක් ආර්ථික වශයෙන් පිරිහෙන විට ඊට අනුරූපීව සදාචාරමය ලෙසද පිරිහෙන බැවිනි. විශේෂයෙන්ම මිනිසුන් මිනිසුන් අතර පැවතිය යුතු මානවීය බැඳීම්, වාණිජමය වුවමනාවන් මත පදනම් වූ සමාජයකදී ආරක්ෂා කළ නොහැක. ධනවාදය තුළ "ශුද්ධ වූ සියල්ල කෙළෙසෙන්නේය"යි මාක්ස් පැවසුවේද මේ අර්ථයෙනි.

අප ඉහත කරුණු මතුකළේ මේ වනවිට අපේ සමාජයේ විනෝදය සඳහා කරන උත්සව හා සමහර ක්‍රීඩා ඉසව් මෙම සදාචාරමය පිරිහීමේ හා මානව ගරුත්වය නොසලකා හැරීමේ සීමාවද ඉක්මවමින් ඇති බව පෙනෙන නිසාය.

විනෝදය මානව වර්ගයාගේ පැවැත්මට අත්‍යාවශ්‍ය දෙයකි. ඒ නිසාම විනෝදවීම හා එවැනි අවස්ථා නිර්මාණය කිරීම ඉතාම හොඳය. අද තිබෙන ප්‍රශ්නය ජනතාවට විනෝදයෙන් සිටීමට හැකියාවක් හා ඒ සඳහා මානසික නිදහසක් නොමැති වීමය. කෙසේ වෙතත් මිනිසුන්ට ඔවුන්ගේ පැවැත්ම වෙනුවෙන් විනෝදජනක අවස්ථාවලට සම්බන්ධවීමට අවශ්‍යය. ඒ සඳහා විවිධ ක්‍රීඩා ඉසව් පැවැත්වීම සංගීත සංදර්ශන පැවැත්වීම පොදුවේ ගත්කල අත්‍යාවශ්‍යය. එහෙත් පසුගිය කාලයේ මෙම සමහර උත්සව අවස්ථාවල සංවිධානය කර තිබූ ක්‍රීඩා ඉසව් හා සමහර සංගීත සංදර්ශනයන්හි වේදිකා මත සිදුකරන දේවල් මානව ගරුත්වයට, විශේෂයෙන් කාන්තාවන්ගේ ගරුත්වයට හානි නොකරන්නේද යන ගැටලුව මතුවේ.

## අන්ධානුකරණයට ගොදුරුවීම

පසුගිය අලුත් අවුරුදු උත්සව සමයේත්, සමහර ආයතන විසින් සේවකයින් සඳහා විටින් විට පවත්වන වැඩමුළු වැනි උත්සවවලදීත් යොදාගනිමින් තිබෙන විනෝදකාමී ලෙස හිතෙන එහෙත් මානව ගරුත්වයට හානි කරන ක්‍රීඩා ඉසව් රැසක් තිබිණි. මේවා සමහරවිට වෙනත් රටවල දේවල් අනුකරණයට යාම විසින්ද සිදුවන බව පෙනේ.

මෑතකදී සමහර ස්ථානවල පැවැත්වූ අවුරුදු උත්සවවල තිබුණු ක්‍රීඩා ඉසව් කිහිපයක් උදාහරණ ලෙස ගත හැක. එකක තිබුණේ කාන්තාවන් පේලියට හිඳ සූප්පුව සහිත කිරි බෝතල් තමන්ගේ කිහිල්ලේ ගසාගෙන සිටියදී පිරිමින් පැමිණ එම සූප්පුවෙන් කිරි උරා බොන ක්‍රීඩාවකි. එය විනෝදජනක ලෙස පෙනුණද එය එක් ලිංගික චර්යාවක් සංකේතවත් කරන බව පෙනුණි. එසේම බනිස් කෑමේ තරගයක්ද විය. එය සම්ප්‍රදායික බනිස් කෑමට වඩා වෙනස් වූයේ බනිස් ගෙඩිය කාන්තාවන්ගේ බෙල්ලේ එල්ලා තිබීම නිසාය. එම බනිස් ගෙඩිය කාන්තාවන්ගේ බෙල්ලේ එල්ලා තිබුණේද කාන්තාවන්ගේ උකුළු ප්‍රදේශයෙන් ටිකක් පහළට වනසේය. එවිට දෑත් බැඳි පිරිමි පැමිණ එම බනිස් ගෙඩිය කටින් කෑ යුතුය. එයද සිනහ උපදවන එකක්සේ පෙනුනද එයත් ලිංගික චර්යාවක් සිහිකරන්නක් විය.

මෙවා අලුත් ක්‍රීඩා ඉසව් ලෙස නව නිර්මාණශීලී දේවල් ලෙස අයෙක් අර්ථකථනය කළද මේ තුළ ස්ත්‍රී පුරුෂ ලිංගික චර්යා සිහිගැන්වීම වැළැක්විය නොහැක. ඉන් සැබැවින්ම සිදුවන්නේ ස්ත්‍රියගේ ගරුත්වය ප්‍රසිද්ධියේ



කෙළසීමට ලක්කිරීම නොවේද?

## ලිංගික චර්යා හාස්‍යයට

එසේම මෙවැනි තවත් ක්‍රීඩා ඉසව් පැවති අතර ඒවා රූගතකර මුහුණු පොතටද එක්කර තිබුණි. ඉන් එකක් වූයේ උඩු අතට බිම වැතිරගත් කාන්තාවන් තම උදරය මත හුළං පිරවූ බැලුමක් බැගින් තබාගෙන සිටින අතර පිරිමි පැමිණ එක් එක් කාන්තාවන්ගේ ඇඟ මතට පැන තෙරපීම මගින් බැලුම පිපිරවිය යුතුය. බැලුම පිපිරීමත් සමග ඉතිරි වන්නේ ගැහැනියකගේ සිරුර මත පිරිමියෙක් වැතිර සිටීමකි.

එසේම පුටුවක ඉඳගත් පිරිමියෙක්ගේ උකුළ මත හුළං පිරවූ බැලුමක් තබා කාන්තාවක් පැමිණ එම බැලුම මත වාඩිවී තෙරපීමෙන් එම බැලුම පිපිරවීමද ක්‍රීඩාවක් ලෙස තිබුණි. මේ සියලු ක්‍රීඩා ස්ත්‍රී පුරුෂ ලිංගික ඉරියව් සංකේතවත් කරන හා ඊට සිනහසෙන වර්ගයේ විය.

ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ලිංගික චර්යාවන් අපරාධයක් හෝ බැහැර කළ යුතු දෙයක් නොවේ. ඒවා ඉතා ස්වාභාවිකය. ඒවා දෙදෙනෙක්ගේ කැමැත්ත මත සිදුවන මානව ගරුත්වයද රැකෙන ලෙස සිදුවිය යුතු යම් සදාචාරමය සීමාවන් තුළ පවතින දේවල්ය. ලිංගික චර්යා පිළිබඳ සමාජයේ ඇති සමහර සදාචාරමය සීමාවන් දැන් යල්පැන ගොස් තියෙන්නටද පුළුවන. ස්ත්‍රී පුරුෂ සබඳතා වඩා නිදහස් ලෙස පැවැතිය යුතු නම් ඒවා කුහක සදාචාරමය සීමා තුළ සිර කළ යුතු නැත. එහෙත් ඒවා දෙදෙනෙකුගේ පෞද්ගලික කාර්යයන් මිස ප්‍රසිද්ධියේ කරන ක්‍රීඩාවල සංකේත වීම නිවැරදි නැත. එහෙත් බාල විනෝදය සඳහා මෙවැනි ක්‍රීඩා ඉසව් පැවැත්වීම නිසා කාන්තාවන්ගේ ගරුත්වයට සිදුවන හානිය විශාලය. සමාජය තුළ ස්ත්‍රී පුරුෂ සබඳතාවල තිබිය යුතු ගෞරවනීය සම්බන්ධයට සිදුවන හානිය විශාලය.

## සංගීතය හා නර්තනය

දැන් දැන් සමහර එළිමහන් සංගීත සංදර්ශනවලද මෙවැනි ගැහැනු ළමුන් අපහසුවට පත්කරන සිදුවීම් දකින්නට ලැබේ. සංගීත සංදර්ශනයකදී සමහර ගීතවලට පුහුණු කළ තරුණියන් පිරිසක් නර්තන ඉදිරිපත් කිරීම හෝ ඔවුන්ගේ නර්තනවල ස්වරූපය හා ඇඳුම ගැන ප්‍රශ්නයක් ලෙස මෙය නොසැලකිය යුතුය. සමහර සංගීත සංදර්ශනවලදී තරුණ තරුණියන් ප්‍රමාණයක් වේදිකාවට නැග නැටීමද ගැටලුවක් නොවේ. එහෙත් සමහර අවස්ථාවල ගායකයා විසින් සෙනග අතරින් තරුණියක් හෝ කිහිපදෙනෙක් වේදිකාවට ගෙන ගීතයට ඔවුන්ව යොදාගන්නා අවස්ථා තිබේ. එහිදී කරන සමහර ග්‍රාම්‍ය විහිළු, දෙපිට කැපෙන කථා පමණක් නොව එම තරුණියන්ගේ සිරුර එක් එක් තැන් ස්පර්ශ කිරීම වැනි දේ මගින් නොගැලපෙන නර්ථන ඉරියව් මගින් පිරිසක් ඉදිරිපිට ගැහැනු ළමුන් අවමානයට ලක්කිරීම සිදුවේ. මෙය කනගාටුවට කරුණ නම් වේදිකාවට අසිහියෙන් මෙන් ගොඩවෙන ගැහැනු ළමුන්ටද තමන් අවමානයට ලක්වන බව නොතේරීමය.

කිසියම් ගීතයක නර්තනයක අවශ්‍යතාවය මත කෙරෙන සංකේතාත්මක ඉදිරිපත් කිරීම් සෞන්දර්යාත්මක නිරූපනයන් පිළිබඳ මෙහි කිසිදු ගැටලුවක් නැත. අපට කුහක සදාචාරවාදීන් වීමට අවශ්‍ය නැත. එහෙත් ඉතාම ග්‍රාම්‍ය විහිළු නොහොබිනා හැසිරීම් හා සංකේතාත්මක නිරූපනයක් මගින් පෙන්නුම් කරන්නේ සමාජයේ සංස්කෘතික ගරාවැටීමේ ප්‍රකාශනය නම් ඒ ගැන සමාජය ලෙස අප අවධානය යොමු කළ යුතුය.

අවසාන වශයෙන් අවධාරණය කළ යුත්තේ මානව වර්ගයාගේ පැවැත්මට ඔවුන්ගේ සාමූහික පැවැත්මට සාමූහික ක්‍රියාකාරකම් ක්‍රීඩා උත්සව විනෝදශීලී අවස්ථා අත්‍යාවශ්‍යය. එහෙත් ඒවා තුළ සිදුවන සමහර දේවල් මානව ගරුත්වයට විශේෂයෙන් කාන්තාවන්ගේ ගරුත්වයට හානි කරන්නේ නම් කාන්තාවන් විනෝද භාණ්ඩ සේ සලකා කටයුතු කරන්නේ නම් අවම සමාජයීය සදාචාරයත් ආරක්ෂා නොකෙරෙන්නේ නම් ඒවා ආරක්ෂා කරනු වෙනුවට දරුපරපුරක් ඉදිරියේ ඒවා බිඳ දමන්නේ නම් සමාජය ඒ පිළිබඳව මීට වඩා වගකීමෙන් බැලිය යුතුය.

බොහෝදෙනා මෙවැනි දේ කරන්නේ සමාජයේ වැඩි අවධානයක් දිනාගැනීම, ඒ මගින් සමහර වෙළඳ දැන්වීම් වැඩි පිරිසකට ප්‍රචාරය කර ගැනීම, තම නාලිකාවල හෝ මුහුණු පොතේ ග්‍රාහක ප්‍රමාණය වැඩිකර ගැනීම වැනි වාණිජ හා ප්‍රසිද්ධවීමේ අරමුණු සඳහා බවද පැහැදිලිය.

කෙසේ වෙතත් සෑම අතින්ම පිරිහීමට ලක්වූ සමාජයක එම පිරිහීමේ තවත් එක් ප්‍රකාශනයක් මෙයින් පෙන්වන බැවින් උත්සවයන්හි සිදුකරන මෙවැනි ක්‍රීඩාංග පමණක් නොව සමස්ත සමාජයම වඩා දියුණු පරිවර්තනයක් වෙත ගෙන යා යුතු බව අවධාරණය කර ගත යුතුය.

> ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ලිංගික චර්යාවන් අපරාධයක් හෝ බැහැර කළ යුතු දෙයක් නොවේ. ඒවා ඉතා ස්වාභාවිකය. ඒවා දෙදෙනෙක්ගේ කැමැත්ත මත සිදුවන මානව ගරුත්වයද රැකෙන ලෙස සිදුවිය යුතු යම් සාදාචාරමය සීමාවන් තුළ පවතින දේවල්ය. ලිංගික චර්යා පිළිබඳ සමාජයේ ඇති සමහර සදාචාරමය සීමාවන් දැන් යල්පැන ගොස් තියෙන්නටද පුළුවන. ස්ත්‍රී පුරුෂ සබඳතා වඩා නිදහස් ලෙස පැවැතිය යුතු නම් ඒවා කුහක සදාචාරමය සීමා තුළ සිර කළ යුතු නැත. එහෙත් ඒවා දෙදෙනෙකුගේ පෞද්ගලික කාර්යයන් මිස ප්‍රසිද්ධියේ කරන ක්‍රීඩාවල සංකේත වීම නිවැරදි නැත. එහෙත් බාල විනෝදය සඳහා මෙවැනි ක්‍රීඩා ඉසව් පැවැත්වීම නිසා කාන්තාවන්ගේ ගරුත්වයට සිදුවන හානිය විශාලය. සමාජය තුළ ස්ත්‍රී පුරුෂ සබඳතාවල තිබිය යුතු ගෞරවනීය සම්බන්ධයට සිදුවන හානිය විශාලය.



"ස්ථානීය පරිමාණයෙන් ඉතා හදිසි කාර්ය ඉටු කළ විට යමෙකුගේ විප්ලවීය උද්යෝගය මොට වේ නම් සහ නිර්ධන පංති ජාත්‍යන්තරවාදය යමෙකුට අමතක වේ නම්, යමෙකු නායකත්වය සපයන විප්ලවය චාලක බලයක්ව පැවැත්ම නතරව සුවපහසු නිදිමතකට කිඳ බසී. භූමිය දිනා ගැනීම සඳහා අපේ සමාදානයෙන් තොර සතුරා වන අධිරාජ්‍යවාදය විසින් එම තත්වය උපයෝගී කර ගනු ඇත. නිර්ධන පංති ජාත්‍යන්තරවාදය යුතුකමක් පමණක් නොව විප්ලවීය අනිවාර්යතාවයක්ද වේ. අපේ ජනතාවට අප උගන්වන්නේ එසේය."

**චේ ගෙවාරා**

**සමාජවාදය සහ මිනිසා සහ වෙනත් රචනා, 29 පිටුව**

# පොලිටිකල් පංතිය

පොලිටික්ක එන්නෙ කවද්ද කියන සංවාදෙ නැති වෙලාම ගිය වගේ කාලෙක උදේ ළමයි පංතියට එනකොට පොලිටික්ක පුටුවෙ වාඩි වෙලා පරණ පත්තරයක් බලනව. සමහරු පංතියට ඇතුල් වෙන්න කලින් ඇස් පිහදැම්මෙ දකින්නෙ හීනයක්ද නැද්ද කියල තහවුරු කරගන්න.

"ගුඩ් මෝනිං සර්" අනුරුද්දිය කියද්දි "වෙරි ගුඩ් මෝනිං සර්" කියාගෙන වසන්තියත් එකතු වුණා.

"ආයුබෝවන් ළමයිනේ..." අත් දෙක මූණෙ පැත්තකට කරල පොලිටික්ක හිනා කටයි මල් දෙකටයි එක්ක කිවුවෙ පහුගිය කාලෙ පුරුද්දට වගේ.

"ආයුබෝවන් සර්..." පංතියෙ ඔක්කොම වගේ නැගිටල මූණ පැත්තෙන් අත් එකතු කරල කිවුවම තමයි පොලිටික්කට ලැජ්ජ හිතුණෙ.

"ඇයි ළමයිනේ... මොකෝ මෙහෙම" පොලිටික්ක හිතල කිවුව නෙමෙයි, කියවුණා.

"අපිත් පොලිටිකල් කරනවනෙ සර්... පුරුදු වෙන එක ඉස්සරහට වටිනවනෙ..." මංජුව ඇඟට නොදැනි කිවුව.

"ආ... එහෙමද? ඒත් දැන් ඔය වගේ රඟපෑම්වලට මිනිස්සු රැවටෙන්නෙ නෑ" පොලිටික්ක කියන්නෙ අත්දැකීමෙන්මයි. "මිනිස්සු දැන් ආයුබෝවන් කියන්න කලින්... ඔයාලා කවුද කියල අහනව"

"එහෙම අහන එක හරිනෙ සර්. මිනිස්සු රැවටිලා රැවටිලා හෙම්බත් වෙලානෙ ඉන්නෙ. දැන් හරි පරිස්සම්" සමන කෙටියෙන් කිවුව.

"ඔය කිවුවට මිනිස්සුන්ට කොච්චර කාලයක් මතක තියෙයිද දන්නෙ නෑ" කනියටත් හිතෙන දේවල්. "මෙහෙ මිනිස්සුන්ට මතක තියෙන්නෙ සති දෙකයි කියනව නේද?"

"නෑ... නෑ... මේ සැරේ මිනිස්සුන්ට අමතක වෙන්න විදිහක් නෑ. පරිප්පුව දිගටම ලැබෙනව... සර්ලගෙ ගෝටා සර් තමයි මිනිස්සුන්ට හොඳටම තේරුම් කළේ... නේද සර්" මංජුව කියපු කතාවට හැමෝටම හිනා පැන්න, පොලිටික්කට ඇරෙන්න.

"ඔය කතා වැඩක් නෑ ළමයිනේ... ඔයගොල්ල මාව හෙවුවෙ නැද්ද පහුගිය කාලෙ..." පොලිටික්ක වැඩේ අවුල් නිසා තමන්ගෙම පැත්තට හැරෙව්ව. "මං ඔයාලට කියන්න එන්න හිටියට බැරි වුණා. හදිස්සියෙමනෙ වුණේ"

"ආ... ඒව අමතක කරන්න සර්... ගිය දේ ගියා. කොහොම හරි සර්ට යහතින් ආපහු එන්න ලැබුණානෙ" මංජුව කිවුවෙ කතාව වහන්න බලාගෙන.

"ඔය ළමයි හිතුවෙ මං කොහේ ගියා කියලද?" පොලිටික්ක වටෙන් ගිහින් ගෙටම එනව. ළමයි ඒ ගැන සද්දෙ වහල ඉන්න එක පොලිටික්කට අප්සෙට්.

"කමක් නෑ සර්. සර්ට කරදරයක් වුණේ නෑනෙ" අනුරුද්දියත් අනුකම්පාවෙන්.

"ඇයි ඔය ළමයි හිතුවෙ මම ලෙඩ වෙලා හිටිය කියලද?" පොලිටික්ක අග මුල තෝරන්න යනව.

"අපි නොකියන්න කතා කරගෙන හිටියෙ සර්" සමන හැමෝම දන්න රහස කිවුව. "ඇයි සර් නරා වලටම බැස්ස නේද?" "ඡන්දෙ ඉල්ලන්න වෙන පක්ෂයක් තිබ්බෙම නැද්ද?", "අපිටත් ලැජ්ජයි සර්..." තැන් තැන්වලින් ප්‍රශ්න වැලක්.

"නෑ ළමයිනේ මේක... මේක අහම්බයක්... " පොලිටික්ක මොනවද කියන්න හැදුව. "මමත් කැමැත්තෙන් නෙමෙයි... බේරෙන්න බැරිවුණා..." පොලිටික්කට තේරුණා සමන කලින්ම වනසල කියල. "ඔය ළමයි කියන එක ඇත්ත. ගම්වල අමාරුයි දැන් ඡන්ද කරන්න. මමත් දන්න දන්න අයගෙ ගෙවල්වලට ගියේ යාළුකන් අලුත් කරගන්න. කාලෙකින් යන්න බැරි වුණ එකේ. ඡන්ද ගැන කතා කළේම නෑ. මොන ඡන්ද හෙවිල්ලක්ද? මිනිස්සු ඇඟට ගොඩවෙනව, ඡන්දෙ ඉල්ලන්න ආවා කියල දැනගත්ත ගමන්" පොලිටික්ක ඇඟ බේරගන්න පොදු දේශපාලන විරෝධෙක හැංගෙන්න බැලුව.

"සර් ඕක ඇත්තම නෙමෙයිනෙ. මිනිස්සු තරහ දේශපාලනේට නෙමෙයි සර්... සර්ලගෙ පක්ෂත් එක්ක. තමන්ගෙ ජීවිත කාලකණ්ණි කරපු එක ගැන මිනිස්සුන්ට කේන්ති එන එක සාධාරණයි. සර්ලගෙ ඇඟට කඩා පනින්නෙ ඒ කේන්තියට. තමන් විඳින හැම දුකකටම මේ වෙනකම් රට කරපු පක්ෂ වගකියන්න ඕනැ කියල මිනිස්සු දැන් දන්නවා. ආයි වරෙල්ලකො ඡන්දෙ ඉල්ලන්න කියන්නෙ ඒ හින්ද. ප්‍රශ්නෙ මුල ඉඳලදම දැකපු, අදූෂිත අලුත් කණ්ඩායමකට දීල බලන්න මිනිස්සු තීරණය කළේ ඒකයි. ඒ හින්ද තමයි රනිල්ල ඡන්දෙ කල් දැම්මෙ. ඒ හින්ද තමයි අපේක්ෂකයෙක් විදිහට ඉන්න ගමන්ම සර්ට ආපහු උගන්නන්ට එන්න වුණේ. ඇත්තම කතාව සර්ලට පක්ෂ නම කියල ඡන්දෙ ඉල්ලන්න බැහැ..." සමනට සැර වැඩිදත් කියල හිතුණෙ පොලිටික්ක පුටුවෙ හාන්සි වෙලා පත්තරෙන් පවන් ගහගන්නව දැකල.

කවුළුව හැර තබමි

# ලොන්තලන්තයක් නොවන්නට




පොඩි එකාට නීතිය අකුරටමය. මහ එකාට නීතිය රුයිතෙටමය. පොඩි එකා ඉදිරියේ නීතිය යගදාවක් සේ කෙලින්වෙන නීතිය මහ එකා ඉදිරියේ පරඬැලක් සේය. මේ සමාජය තුළ මෙසේම අපි දිවි ගෙවනවාද, නැතිනම් මෙය වහ වහා වෙනස් කළ යුතුද යන ප්‍රශ්නයට ඉහත සිද්ධි දෙක පමණක්ම ප්‍රමාණවත්ය. පංචෙන්ද්‍රියන් සුසර මිනිසුන්ට නම් මේ සාපරාධී සමාජ ක්‍රමය තවදුරටත් ඉවසා සිටිය නොහැක; දරා සිටිය නොහැක.

වෙන රටවල සිරගෙවල් පිරෙන්නේ මිනීමරුවන්, කුඩු ජාවාරම්කරුවන් හෝ ස්ත්‍රී දූෂකයන්, ළමා අපචාරකරුවන් වැනි අපරාධකරුවන්ගෙනි. අපේ රටේ උත්තරීතර යැයි කියනු ලබන පාර්ලිමේන්තුව පිරෙන්නේ ඉහත කී අයවලුන්ගෙනි. අපරාධ ගරු කටයුතු දේ ලෙස සලකන රටක අපරාධකරුවන් ගරු කටයුතු තැන්වල අසුන් ගැන්වීමද පුදුමයට කරුණක් නොවේ.

පොල්ගෙඩි 20ක් හොරෙන් කැඩූ වරදට "අවුරුද්දක බරපතළ වැඩ ඇතිව අයෙක් සිරගෙට." "රත්තරං කිලෝ ගණනක් හා ජංගම දුරකථන තොගයක් හොරෙන් ගෙනා පාර්ලිමේන්තු මන්ත්‍රී අලි සබ්රි රහීම් විනාඩි ගණනාවකින් ඇප ලබා නැවත පාර්ලිමේන්තුවට"

මෙ මේ දිනවල චිර ප්‍රසිද්ධ පුවත් දෙකකි. නරක දේවල්වලින්ම පිරීගිය අප රටේ පාර්ලිමේන්තුව තුළ හොඳ දේවල් තුනක් හෝ ඉතිරිව තිබීමම යම් සහනයකි. ඒ හොඳ දේවල් තුන මොනවාද යනු රටම දනිති.

අපරාධ ගරු කටයුතු දේ ලෙස සැලකූ දේශපාලන සංස්කෘතියට තිත තැබීමට සමාජය සමත් වන්නේනම් මහජන නියෝජිත ආයතන අපරාධකරුවන්ගෙන් තුරන් වනු ඇත. එතෙක් අපට ජීවත් වන්නට සිදුවනු ඇත්තේ මේ ලොන්තලන්තයේය.

# දන්නැද්ද? ඩාං වෙන - ඩූම් වෙන අපේ රට



මහ බැංකුව මහා දවල් හොරා කෑවේය. හොරකම හා පාඩුව ඉතිරි විය. හොරා නැතිවිය. මහ බැංකුවේ සේප්පුවකින් ලක්ෂ 50 නැවත මෑතකදී හොරා කෑවේය. හොරකම හා පාඩුව ඉතිරි විය. හොරා නැතිවිය. අයිතිකරුවෙක් නැතිව ඉඩම්වල ඉබේ ගෙවල් පැලවෙන මේ අරුම පුදුම රටේ මේවා මහා දේවල් දැයි කෙනෙකුට සිතිය හැක. මේ අලකංලච් මැද මෙ රටේ පාලක පට්ට හොරු ටික, අප නොව අරුන් හොරු යැයි කියමින් ජනතාවගේ කරමතින් පාර්ලිමේන්තුවට සැපත්වී තවමත් යහතින් කල් ගෙවති. ඔවුන් ජනයාට වරෙක වඳ කොත්තු නාටකය පෙන්වති. වරෙක ජෙරම් නාටකය පෙන්වති. එවැනි නාටක අපේ රටේ වැහි වැහැලාය. ඒවා බලා අපේ රටේ බහුතරය අධ්‍යාත්මය හිරිවට්ටා ගනිති. පාලකයෝ අර රුසියාවේ වස්කා නමැති බළලා මෙන් දිගටම රට අනුභව කරමින් යයි.

අපේ රටේ බහුතරයක් වැඩිහිටියෝ විවිධ රෝගාබාධවලින් පෙළෙති. මේ රෝග අතර දරුණුම රෝගය අධ්‍යාත්මක දරිද්‍රතාවයයි. චින්තනමය දිළිඳුකමය. තවමත් මේ රටේ මෙහෙව් පාලකයන්ට ජනතා මුදල්වලින් ජොලි කරමින් ජනතාවට කෝචොක් කර කර ජොලියේම කල්ගත කිරීමට අවකාශය විවෘත වී තිබෙන්නේ ඒ නිසාය. විවිධ වර්ගයේ හාස්කම්වලින්ම සහනය පතන්නේ මේ අධ්‍යාත්මික දිළින්දන්ය.

# දිගත පතල සුවඳැති සොඳ සඳුන් කඳ සිඳිත මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ



තරුණ වයසේ සිටින නමුත් ඒ හැමකෙනෙකු තුළම තුරුණු ගුණය පිහිටන්නේ නැත. තරුණකම තිබූ පමණින් තාරුණ්‍යය පිහිටන්න්නේ නැත.

අපේ රටේ විවිධ විද්‍යුත් නාලිකා එක රැයකින් 'සුපිරි වීරයින්' දහස් ගණන් බිහිකරයි. එපමණින් ඔවුන් තුළ වීරත්වය ගුණය නොපිහිටයි. ඔවුහු හුදු අයිසින් වීරයෝම පමණි. අපට අනුව කෙනෙකු සැබෑ වීරයෙකු වීමට නම් පළමුව ඔහු තමා ජීවත් වන සමාජයේ සමාජ සංවර්ධන නියමයන් හා චලනයන් නිසි පරිදි නිවැරදි දේශපාලන දෘෂ්ටියකින් තේරුම් ගත යුතුය. එපමණක් මදිය. ඔවුහු පවතින සමාජ ක්‍රමය වෙනස් කිරීමටත් මිනිසත් බව පිරි සැබෑ මිනිස් සමාජයක් නිර්මාණය කිරීම වෙනුවෙන් නොපසුබස්නා වීර්යයෙන් සටන කළ යුත්තාහ.

අද අපි ස්මරණය කරන්නේ එවන් විරුවන් පිරිසකි. ඔවුහු නම් 88 - 89 වකවානුව තුළ තම මව්බිමේ නිදහස සහ පංතියේ විමුක්තිය වෙනුවෙන් සටන් වැද දිවි පිදූ විරු සිසුවෝම වෙති. හැම වසරකම ජුනි 20 දින අපි ඔවුන් සමරමු. ජීවිතයේ පටුම න්‍යාය පත්‍රවලට කොටු නොවූ ඔවුන් මානව වර්ගයාගේ උසස් නිදහස පළමු තැනෙහිලා සටන් වැද සැබෑ ජීවිතය හා සැබෑ සමාජය කුමක්ද, ඒ සඳහා සටන් කළ යුත්තේ ඇයිද යන පාඩම සමකාලීන පරපුරටත් අනාගත පරපුරටත් තම ජීවිත අභ්‍යාසයෙන්ම කියාදී නික්ම ගියෝය. ඒ පුහු අරගලකරුවන් මෙන් හිස් අතින් නොව, අනාගත පරපුරට දහසක් බර පාඩම් ඉතිහාස පොතේ ලියා තබමිනි.

2023 අප්‍රේල් 25

# අනාගතය දක්වා බලපාන බේදවාචකයක් ඩොලර් කුට්ටිවලින් එහෙට මෙහෙට කිරීම මොනතරම් බේදවාචකයක්ද?

මෙය ලෝක ඉතිහාසයේ විශාලතම සමුද්‍ර රසායනික විනාශය. මෙයට පෙර මේ තරම් විනාශයක් සිදුවී නැහැ. අපේ මුහුදු පැලෑටිවලට සිදුවූ විනාශය, මුහුදු ජීවීන්ට සිදුවූ විනාශය, අපේ වෙරළ තීරයට සිදුවූ විනාශය, අපේ වායුගෝලයට සිදුවූ විනාශය, මේ ආදී වශයෙන් ලෝක ඉතිහාසයේ මෙතෙක් සිදුවී තිබෙන විශාලතම සමුද්‍රීය රසායනික විනාශය බව තහවුරු වෙනවා.

මෙය අපේ රටේ මෙවැනි බේදවාචක සිදුවූ පළමු අවස්ථාව නොවෙයි. මෙතෙක් සිදුවූ සෑම බේදවාචකයක් පිටුපසම ඉතාමත් නරක පන්නයේ දේශපාලන සංස්කෘතියක් හරහා අපරාධ සිදුවී තිබෙනවා. 2004 සුනාමියෙන් 35,000කට වැඩි පිරිසක් මියගියා. අපේ වෙරළ තීරය මුළුමනින්ම විනාශ වුණා. නමුත් අවසානයේ ශේෂ පත්‍රය ලෙස ඉදිරිපත් වී තිබෙන්නේ සුනාමි අරමුදල් වංචාව පිළිබඳවයි. ඊළඟට යුද්ධයෙන් දීර්ඝ විනාශයක් සිදුවුණා. ජීවිත දහස් ගණනක් නැතිවී කෝටි ප්‍රකෝටි ගණන් දේපොළ අහිමි වුණා. අපේ රට වසර ගණනාවකින් ආපස්සට ඇදී ගියා. නමුත් යුද්ධය අවසන් වුණාට පසු එළියට එන්නේ මිග් ප්‍රහාරයක යානා ගනුදෙනු, අවි ආයුධ ගනුදෙනු ඇතුළු දේවල්. පසුගිය කාලයේ කෝවිඩ් වසංගතයෙන් විශාල බේදවාචකයක් සිදුවුණා. නමුත් එය අවසන් වන විට සාකච්ඡා කෙරෙන්නේ ඇන්ටිජන් ගනුදෙනු, නිරෝධායන ගනුදෙනු, හෝටල් වෙන්කිරීමේ ගනුදෙනු, සැනිටයිසර් ගනුදෙනු ආදිය පිළිබඳව. මේ වන විට රටේ ආර්ථිකය බිඳ වැටී තිබෙනවා. තෙල්, විදුලිය, අත්‍යවශ්‍ය භාණ්ඩ නැතිව ගියා. නමුත් මේ බේදවාචකය තුළ සාකච්ඡා වෙන්නේ ගල් අඟුරු වංචාව, තෙල් වංචාව වගේ දේවල්. තව පැත්තකින් සෞඛ්‍ය ක්ෂේත්‍රය විශාල වශයෙන් කඩා වැටී තිබෙනවා. ඇස් රෝග වෙනුවෙන් පාවිච්චි කරන ඖෂධ නිසා නුවරඑළිය රෝහලෙන් ප්‍රතිකාර ගත් 10දෙනෙකුගේ ඇස් නොපෙනී ගොස් තිබෙනවා. සියලුම බේදවාචකයන් මේ ගොල්ලන්ට බිස්නස් එකක්. මේ නෞකාවේ ප්‍රශ්නයත් අන්න ඒ වගේම මේ ගොල්ලනට බිස්නස් එකකක්.

විශාල පාරිසරික හානියකට අදාළ වන්දියකින් රට ගොඩගත යුතුයි කියලා අපි කවුරුත් කල්පනා කරන්නේ නැහැ. නමුත් ආර්ථිකයේ සිදුවී තිබෙන බිඳ වැටීමට මේ වන්දිය යම් පිටුවහලක් කරගත යුතුයි. ඒ සම්බන්ධ වගකීම තිබෙන්නේ දේශපාලන අධිකාරියට සහ නිලධාරීන්ට. තමන්ගේ හදවත තුළ යම් තෙතමනයක් තිබෙනවා නම්, අනාගතයේ මිනිය නොහැකි කාලයක් දක්වා පරිසරයට සිදුවන හානිය ගැන තෙතමනයක් තියෙන්න ඕනෙ නැද්ද? අපි කවර මිනිසුන් එක්කද මේ රට පාලනය කරන්නේ. අපි කවර මිනිසුන් එක්කද මේ තීන්දු තීරණ ගන්නේ. මහා බේදවාචකයක්, අනාගතය දක්වා බලපාන බේදවාචකයක් ඩොලර් කුට්ටිවලින් එහෙට මෙහෙට කරන්න පුළුවන් නම්, එය මොනතරම් බේදවාචකයක්ද? සෑම බේදවාචකයක්ම චෞර කණ්ඩායමකගේ ධනය එක්රැස් කර ගැනීමේ මගඩියක් බවට පත්කර ගෙන තිබෙනවා. සුනාමිය, යුද්ධය, ඖෂධ ගෙන්වීම, ගල්අඟුරු ගෙන්වීම, තෙල් හිඟය වගේම එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ බේදවාචකයත් ඔවුනට මගඩියක්.

ජාත්‍යන්තර සාගර නීතිය අනුව සෑම රටකම භෞමික භූමි ප්‍රදේශයක් වෙනවා. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පරිපාලන දිස්ත්‍රික්ක 25ක් සහ ඊට අයත් මුහුදු සීමාවකුත් පවතිනවා. ගොඩබිම සිට නාවික සැතපම් 12ක් දක්වා සාගරය අපේ භෞමික සීමාවටම අයත් වෙනවා. මේ නැවේ බේදවාචකය සිදුවී තිබෙන්නේ අපේ භෞමික සීමාව තුළ. අපේ භෞමික ප්‍රදේශය තුළ ඒ වාහනය නඩු භාණ්ඩයක් නම් එය ආරක්ෂා කර ගැනීම අපේ වගකීමක්. ඒ නිසා මෙම නෞකාව අපේ මුහුදු සීමාවෙන් එහාට ඇදගෙන යන්න නියෝග දුන්නේ කවුද? කියලා අපි දැනගන්න ඕනෑ. දෙවනුව අපේ හානිය තක්සේරු කර ගැනීම සඳහා බාධාවක් නම්, එය රැගෙන යාම ගැන විශේෂයෙන් සොයා බලන්න ඕනෑ. බොහෝ අය සඳහන් කරනවා, ගිනි ගත්තේ නැවේ ඉන්ධන නොවෙයි කියලා. නැවේ රැගෙන ආ කන්ටේනර්වල තිබුණු ද්‍රව්‍ය ගිනිගත් බව නාවික විශේෂඥයන් පෙන්වා දෙනවා. නමුත් මේ නැවේ ගිනි ගත්තේ, ඉන්ධනද? ප්‍රවාහනය කළ භාණ්ඩද කියලා කිසි කෙනෙකුට කිසි සහතිකයක් දෙන්න බැහැ. අපේ විද්වත් කමිටුවට, අපෙ පරිසරවේදීන්ට ඒ නැවට ගොඩවීමට ඉඩ දුන්නේ නැහැ. අපේ පරීක්ෂණ නිලධාරීන්ට ඇතුල් වෙන්න ඉඩ නොදුන්නේ ඇයි? නැවට ආසන්න මීටර් 500ක් දක්වා අපේ කිසිම නිලධාරියෙකුට ඇතුළත් නොවෙන්න වගබලා ගත්තා. මේ නිසා හිතාමතාම නැව ගිල්වීමකට භාජනය කළා දැයි සැකයක් තිබෙනවා. නිරවුල් කර ගන්න බැරි සැක සංකා විශාල ප්‍රමාණයක් අප හමුවේ තිබෙනවා.

මේ මුළු සාකච්ඡාවම ගොඩනැගී තිබෙන්නේ වන්දියක් කේන්ද්‍රගත කරගෙන. නමුත් මෙතන වන්දිය පමණක් නොවෙයි, අපේ රටේ මූලික පනත් 20කට ආසන්න සංඛ්‍යාවක් උල්ලංඝනය කර තිබෙනවා. වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ පනත, නාවුක වෙළඳ පනත, ජාතික පාරිසරික පනත, දණ්ඩනීති සංග්‍රහයේ 273, 278 සහ 279 වගන්ති උල්ලංඝනය වී තිබෙනවා. වන්දිය පමණක් නොවෙයි, පුපුරණ ද්‍රව්‍ය සමග යාත්‍රා කිරීම, පිපිරීමකට ඉඩදීම වගේ වරදවල් දණ්ඩනීති සංග්‍රහය අනුව සිදුකර තිබෙනවා. වන්දිය පිළිබඳ සාකච්ඡාව පැත්තකින් තැබුවත්, පාරිසරිකමය පනත් ගණනාවක් උල්ලංඝනය කර තිබුණත් ඒ කිසිවකට විරුද්ධව නඩු පවරන්න මේ දක්වා කටයුතු කර නැහැ. මේ නඩු පවරන්නේ නැත්තේ සමාගම සහ පැමිණිලිකරු මාරුවීමෙන්දැයි සැකයක් අපට ඇති වෙනවා. මේ මුළු ක්‍රියාවලියම දියත්කර තිබෙන්නේ එම සමාගම ආරක්ෂා කිරීම, ඔවුන්ට අවම වගකීම පැවරීම, ඔවුන්ව ගලවා ගැනීම වැනි තත්වයන් තුළයි.

සිංගප්පූරුවේ නඩු පැවරීම පිළිබඳව දැන් බොහෝ විට සාකච්ඡා කෙරෙනවා.




ජාතික ජන බලවේගයේ නායක,
පාර්ලිමේන්තු මන්ත්‍රී
**අනුර කුමාර දිසානායක සහෝදරයා**

අධිකරණ ඇමති විජේදාස රාජපක්ෂ අමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවේදී මුලින්ම කීවේ මේ වෙනුවෙන් පත්කළ නීතිඥ මණ්ඩලයත් විද්වත් කමිටුවත් තීරණය කර තිබෙන්නේ සිංගප්පූරුවේ නඩු පැවරිය යුතු බවයි. නමුත් මේ පසුව පාර්ලිමේන්තුවේදී හෙළි වුණේ විද්වත් කමිටුවේත් නීතිඥ මණ්ඩලයේත් නිගමනය සිංගප්පූරු අධිකරණයේ නඩු පැවරීම නොවෙන බවයි. රාජ්‍ය ඇමතිවරයා මීට ටිකකට පෙර පාර්ලිමේන්තුවේදී කීවේ ඔහුගේ පෞද්ගලික තීරණයත් ලංකාවේ නඩු පැවරිය යුතු බවයි. හැබැයි අධිකරණ ඇමතිවරයාගේ පළමු ප්‍රකාශයේ සිට සියලු අවස්ථාවල කියැවුණේ සිංප්පූරුවේ නඩු පැවරිය යුතු බවයි. සිංගප්පූරුවට යනවාය කියන පළමු තර්කයේ සිටම පාර්ලිමේන්තුවට කරුණු සඟවා තිබෙන බව හරිම පැහැදිලියි.

දැනටමත් සාකච්ඡා කර ඇති විදිහට සිංගප්පූරුව සහ එංගලන්තය අතර අත්සන් කළ සම්මුතියක් තිබෙනවා. ඒ සම්මුතිය අනුව නාවික විනාශයකදී ලබාදෙන උපරිම වන්දිය පිළිබඳව ඒ ඒ අවස්ථාවේදී එකඟතාවන්ට පැමිණෙනවා. මෙයට යටත්ව අදාළ රක්ෂණ සමාගම එංගලන්තයේ පනවා තිබෙන නඩුවකින් ප්‍රකාශ කර තිබෙන්නේ මේ වෙනුවෙන් ලබාදිය හැකි උපරිම වන්දිය ඩොලර් මිලියන 26ක් බවයි. දැන් අවුරුදු එකහමාරක් පුරා මේ නඩුව පවත්වාගෙන ගියත් අදාළ පාර්ශ්වකරුවෙකු වී සිටින අපි වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව නීතිඥයෙකු ඉදිරිපත් නොකළේ ඇයි? එම නිතීඥ සමාගම වෙනුවෙන් ලංකාවේ පෙනී සිටින ඩී.එන්.එල්.ඇන්.එෆ්. කියන නීතිඥ සමාගම ලංකාවට දැනුම්දී තිබෙනවා. වන්දි මුදල ඩොලර් මිලියන 26ක උපරිමයකට සීමා කරන අවස්ථාවේදීම අපි ඒ නඩුවට යන්න තිබුණා. පාර්ලිමේන්තුවේදී අදාළ ප්‍රශ්නය ගැන මේ සාකච්ඡාව මතුවන තෙක් ඒ ක්‍රියාමාර්ගය නොගත්තේ ඇයි? අදාළ රක්ෂණ සමාගමට ඩොලර් මිලියන 26ක් කියන්නේ නොසලකා සිටිය යුතු තරම් සොච්චමක්. අපි ලබාගත යුතු වන්දිය වෙහෙරක් නම් ඩොලර් මිලියන 26ක් කියන්නේ අග්ගලා ගුලියක්.

මෙයට මැදිහත් වුණු නිලධාරීන් අතර ගනුදෙනුව තිබෙන්නේ මෙන්න මෙතන. වන්දි සීමාවකට යටත් කර ගැනීමයි, මේ අයගේ අපේක්ෂාව. යම් තාක්ෂණික ප්‍රශ්නයක් හැරුණු කොට මෙයට වන්දියක් ලබාදිය යුතුද, නැද්ද යනුවෙන් අධිකරණයේ විභාගවීමට තිබෙන ඉඩ ඉතාමත්ම අඩුයි. අධිකරණයේදි විමර්ශනය කෙරෙන්නේ වන්දියේ ප්‍රමාණය ගැන. අපේ විද්වත් කමිටුව ඩොලර් බිලියන 6.4ක වන්දියක් ඉල්ලා තිබෙනවා. ඊට අමතරව විනාශයේ ප්‍රමාණය මත වන්දිය වැඩිවිය යුතු බව අපේ පැත්තෙන් කියනවා. නමුත් මේ වන විට සිදුවෙමින් පවතින්නේ ඩොලර් මිලියන 26ක වන්දි සීමාවක් පැනවීමේ ක්‍රියාවලියයි. අපි සිංගප්පූරුවේ පනවා තිබෙන වන්දි ඉල්ලීමේ නඩුවටත් වඩා බලවත් රක්ෂණ සමාගම විසින් එංගලන්තයේ පනවා තිබෙන වන්දියේ සීමාව පිළිබඳ නඩුව. නමුත් ඒ නඩුව අවුරුදු එකහමාරක් ගියත් තාමත් අපි ඒ නඩුවට පාර්ශ්වකරුවෙකු ලෙස මැදිහත්වී නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ එතන. එහෙම නම් අවුරුදු එකහමාරක් ගිහිල්ලත් වන්දියේ සීමාව පනවන නඩුවට අපි මැදිහත් නොවෙන්නේ ඇයි? අනෙක් පැත්තෙන් ඒ සීමාව බලපවත්වන්නේ ලංකාවට නොවෙයි, සිංගප්පූරුවට. එහෙම තිබෙද්දී ඒ නඩුව සිංගප්පූරුවටම ගෙනියන්නේ ඇයි? මේ වන විටත් එම සමාගමට විරුද්ධව ලංකාවේ අධිකරණවල ජනාධිපති නීතිඥයින් මැදිහත්වී කරුණු දක්වන නඩු විභාග වෙනවා. ඉන්ෂුවරන්ස් සමාගම වෙනුවෙනුත් ඒ නඩු වෙනුවෙන් නිතිඥවරුන් පෙනී සිටිනවා. චූදිතයන් වෙනුවෙන් නීතිඥයන් සහභාගි නොවේ යැයි මේ ගොල්ලෝ පූර්ව නිගමනයක් කරන්නේ කොහොමද?

මේ විවාදය වැළැක්වීම සඳහා විජේදාස රාජපක්ෂ මැතිතුමා බොහෝ දේවල් ක්‍රියාත්මක කළා. මේ විවාදය වළක්වන්න ලොකු කුළුගෙඩි පහරවල් එල්ල කළා. පාර්ලිමේන්තුවේ මේ විවාදය ගැනීම දේශද්‍රෝහී ක්‍රියාවක් බව ප්‍රකාශ කළා. දේශද්‍රෝහී, දේශප්‍රේමී බෙදීම කරමින් මේ ගැන කතා කරන අපි දේශද්‍රෝහීන් හැටියට නම් කළා. මේ මවුබිම පිළිබඳව අපි කාගේත් හදවත පත්ලේ තිබිය යුතු දේශප්‍රේමීත්වය හැම වෙලාවේම උපයෝගී කරගත්තේ අන්ත තක්කඩි වුවමනාවන් වසන් කර ගන්න. ඒක තමයි ඉතිහාසය. දේශප්‍රේමියා නිසා එතුමා පාර්ලිමේන්තුවෙන් නැගිට යනවා. පාර්ලිමේන්තුවේ කතා කරන අපි දේශද්‍රෝහීන් හැටියට හඳුන්වනවා. ඉතිහාසයේ හැම තක්කඩියාම හැංගුණේ දේශප්‍රේමී කියන ලේබලය ඇතුලේයි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති හමුවී



එක්සත් රාජධානියේ මැයි දින සැමරුමට එක්වී



කියුබාවේදී රාජ්‍යතාන්ත්‍රිකයින් හමුවී



සරසවි සිසු ගැටලු සාකච්ඡා කරමින්



නේපාලයේ කොමියුනිස්ට් පක්ෂ නායක හමුවී



කේරලයේ ජාත්‍යන්තර වෘත්තීය සමිති සමුළුවක

# අපි නිර්මාණය කරන්නේ අපේ දරුවන් සමගියෙන් සතුටෙන් ජීවත් වෙන රටක්



## ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා

පාලකයාට ජාතිවාදය අවශ්‍ය බවත් බලය පවත්වා ගැනීම වෙනුවෙන් සහ ලබාගැනීම වෙනුවෙන් ආගම්වාදය, ජාතිවාදය යොදා ගැනීම නිසා පොළොව මත ලේ, කඳුළු හෙළා ගලා ගොස් ඇති බවත් පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා, ජාතික ජන බලවේගය ජාතිවාදී බඩපිනුම්වලට ඉඩ නොදෙන මතවාදී අරගලය ඉදිරියට ගෙන යන බවත් දරුවන්ගේ පරම්පරාව සමගියෙන් සතුටෙන් ජීවත් වෙන රාජ්‍යයක් නිර්මාණය කරන බවත් අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 21වැනි දින 'අදිටන' විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමූහිකයේ කුරුණෑගල දිස්ත්‍රික් සමුළුවට එක් වෙමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"පාලකයන්ට දැන් පැරණි විදිහට බලය ගෙනයන්න බැහැ. ඒ නිසා ඡන්ද පවත්වන්න ඒගොල්ලන්ට බැහැ. ඡන්ද අකුළමින් තිබෙනවා. පාලකයා උත්සාහ කරන්නේ, ජනතාවට මුහුණ නොදී නීති කඩමින්, ව්‍යවස්ථාව කඩමින් බලය තියාගෙන යන්න. ඊට අමතරව පරණ පුරුදු ලෙසම ඇති තරම් ජාතිවාදය සහ ආගම්වාදය අවුස්සන්න ක්‍රියා කරනවා. අපේ රටේ ජාතිවාදය සහ ආගම්වාදය මිනිසුන්ගෙන් පැන නගින එකක් නොවෙයි, දේශපාලනයක්. උතුරෙත් දකුණෙත් අපි සැම දෙනාම ඒ ව්‍යසනයේ වින්දිතයෝ. බලය පවත්වා ගැනීම වෙනුවෙන් සහ ලබාගැනීම වෙනුවෙන් ආගම්වාදය, ජාතිවාදය යොදා ගැනීම නිසා ඇති තරම් ලේ, කඳුළු හෙළා තිබෙනවා. නැවත ජාතිවාදයේ, ආගම්වාදයේ පිල්ලි ගොඩනැගෙමින් තිබෙනවා. කිසිදු ජාතිවාදයකට, ආගම්වාදයකට අපි ඉඩ ලබානොදිය යුතුයි. ලෝකයේ දියුණු වුණු සැම රටකම පදනම ජාතිවාදය සහ ආගම්වාදය ප්‍රතික්ෂේප කිරීමයි.

සැම කෙනාටම සාධාරණ ලෙස නීතිය ක්‍රියාත්මක වෙන රටක් ජාතික ජන බලවේගයෙන් නිර්මාණය කරනවා. රනිල්ගෙන් මහින්දට බලය යනවා නම්, මැතිවරණ පවත්වනවා. රනිල්ගෙන් සජිත්ට යනවා නම්, ඒත් පවත්වනවා. නමුත් මේ දක්වා දෙපැත්තට පැද්දුණු දේශපාලන තොටිල්ල දැන් ගැස්සිලා තිබෙන්නේ. මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන බලවේගයකට බලය මාරුවෙනවාට රනිල් වික්‍රමසිංහලා බයයි. රාජපක්ෂ පවුලත් බයයි. මහජනයාගේ දේපළ නීත්‍යානුකූල නොවෙන මාර්ගවලින් එක්රැස්කරගෙන තිබෙන තැන්වලින් යළි පවරා ගන්නා පාලනයක් ජාතික ජන බලවේගයෙන් ගොඩනගනවා.

මේ රටේ පුරවැසියන් මීට වඩා හොඳ රටක් බලාපොරොත්තු වෙනවා. ඒ බලාපොරොත්තුව මගේත්, ඔබේත් සැම දෙනාගේම බලාපොරොත්තුවයි. මේ අපරාධකරුවන්ගෙන් මේ චෞරයන්ගෙන් අපේ රට මුදාගැනීමේ සාමූහික ප්‍රයත්නයක් දැරීමට එකට එකතු වී ඉදිරියට පැමිණීමයි. ඒ සඳහා සියලු දෙනාම එක්වන ලෙස ඉල්ලා සිටිනවා."

# ආගම්වාදී, ජාතිවාදී ගැටුම් ඇති කිරීමේ කුමන්ත්‍රණවලට හසුවෙන්න එපා



## ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික විජිත හේරත් සහෝදරයා

ජනතාවගේ ප්‍රශ්න යටපත් කරමින් ජාතිවාදී, ආගම්වාදී ප්‍රශ්න මතුකර ජනතාව ඒ කුමන්ත්‍රණයේ ගොදුරු බවට පත්කිරීමේ උත්සාහයක් ඇතැයි අනාවරණය කළ ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික විජිත හේරත් සහෝදරයා, ආගම්වාදී, ජාතිවාදී ගැටුම් ඇති කිරීමේ කුමන්ත්‍රණවලට හසුවීමෙන් වළකින ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

විජිත හේරත් සහෝදරයා මෙසේ පැවසුවේ පසුගිය 20වැනි දින ජවිපෙ ප්‍රධාන කාර්යාලයේ පැවති ජාතික ජන බලවේගයේ මාධ්‍ය හමුව අමතමිනි.

"තිස් අවුරුදු යුද්ධය කාලයේ පාලකයන් පුන පුනා කීවේ යුද්ධය අවසන් වූ වහාම මේ රටේ සුබිත, මුදිත ආර්ථිකයක් ගොඩනඟනවා කියලා. යුද්ධය පැවති ප්‍රදේශවල කෘෂිකාර්මික කටයුතු, ධීවර කටයුතු ඇතුළු අනෙකුත් නිෂ්පාදනයන් තුළින් ආර්ථිකය නැවත ගොඩනැගිය හැකි බව පාලකයන් කිව්වා. සහල්නැලිය ප්‍රදේශයේ වී අස්වැන්න පෙන්වමින් එදා සිටි පාලකයන් සහලින් ස්වයංපෝෂිත කරන බවට පුරාජේරු දෙඩවූවා. මුළු රටෙන්ම ධීවර සම්පත නෙළාගෙන රට සංවර්ධනය කරන හැටි කිවුවා. මේ නිසාම ජනතාව විශාල බලාපොරොත්තු තබාගෙන සිටියා. නමුත් යුද්ධය අවසන් කර අවුරුදු 14ක් සම්පූර්ණ වන විට ආර්ථිකය කඩාගෙන වැටිලා සම්පූර්ණයෙන් බංකොළොත් වෙලා ජනතාවට ජීවත් වෙන්න බැරි තත්වයක් උදාකර තිබෙනවා. යුද්ධයට මුවාවී එදා ප්‍රශ්නය යටගසා ගත්තත් රට ගොඩනගන්න කිසිදු සැලැස්මක් පාලකයන්ට නැති බව අද ඕනෑවටත් වඩා ඔප්පුවී තිබෙනවා.

ජීවත් වෙන්න බැරිව අන්ත පීඩනයක සිටින ජනතාවගේ ඇත්ත ප්‍රශ්නය යටගසා ජාතිවාදී, ආගම්වාදී ප්‍රශ්න මතුකර ජනතාව ඒ කුමන්ත්‍රණයේ ගොදුරු බවට පත්කිරීමේ උත්සාහයක් පැහැදිලිව අපි දකිනවා. මේ පිටුපස අනිවාර්යයෙන්ම ඉතිහාසයේ වගේම සැඟවුණු හස්තයන් තිබෙනවා. ඒ නිසා මේ රටේ සියලු ශ්‍රී ලාංකික ජනතාවගෙන් අපි අවධාරණයෙන් ඉල්ලා සිටින්නේ මේ රටේ නැවත ආගම්වාදී, ජාතිවාදී ගැටුම් ඇතිකිරීමේ කුමන්ත්‍රණ ළපතැනම ලොප් කරන ලෙසයි.

කවර හෝ පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් තවත් ජාතිකත්වයක් හෝ ආගමක් නිග්‍රහයට ලක්කරන්න සිදුකරන සියලුම ක්‍රියාමාර්ග අපි දැඩිව හෙළාදකිනවා."

# සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනා වැඩබැරි ආණ්ඩුවට එරෙහිව නැගී සිටිමු

## අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ සභාපති සරෝජා සාවිත්‍රි පෝල්රාජ් සහෝදරිය




ජනතාවගේ ජීවන මට්ටම ඔසවා තැබීමට අසමත්වූ ආණ්ඩු එය වසා ගැනීමේ උපක්‍රමයක් ලෙස ජාතිවාදය සහ ආගම්වාදය අවුළුවමින් සිටින බවට චෝදනා කළ අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ සභාපති සරෝජා සාවිත්‍රි පෝල්රාජ් සහෝදරිය, මේ තත්වය තුළ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනා ඒකරාශී වී වැඩබැරි ආණ්ඩුවට එරෙහිව නැගී සිටිය යුතු බව අවධාරණය කළාය.

සරෝජා සාවිත්‍රි පෝල්රාජ් සහෝදරිය මේ බව පැවසුවේ පසුගිය 20වැනි දින ජවිපෙ ප්‍රධාන කාර්යාලයේ පැවති ජාතික ජන බලවේගයේ මාධ්‍ය හමුව අමතමිනි.

"යුද්ධයෙන් බලපෑමට ලක්වූ කාන්තාවන් විශාල පිරිසක් ඉන්නවා. ආර්ථික අසමානතාවයන්ට විශාල වශයෙන් ගොදුරු වූ විශේෂයෙන්ම යුද්ධයෙනුත් පීඩාවට පත්වූ පිරිස කෙරෙහි ආණ්ඩුවේ අවධානය යොමු කර නැහැ. ජාතික සමගිය ගොඩනැගීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළේ නැහැ.

එවැනි වටපිටාවක යුද සැමරුම ආසන්න දිනවල නොයෙක් විදිහේ සියලුම වර්ගයේ ආගමික අන්තවාදයන්, සියලුම වර්ගයේ ජාතික අන්තවාදයන් හා මූලධර්මවාදී කණ්ඩායම් නැවත තමන්ගේ බලය වර්ධනය කරගෙන දේශපාලන ගේම් එකට උදව් කරන්න මතුවෙමින් සිටිනවා. මේක දේශපාලනික උගුලක්.

ඒ නිසා අපි ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනා ඒකරාශීවී වැඩබැරි ආණ්ඩුවට එරෙහිව නැගී සිටිය යුතු බවයි."




බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.